

# සෙලෙන්දිවා
## ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2021

# අන්තර්ගතය


සභාපතිගේ සමාලෝචනය . . . . . 2
අධ්‍යක්ෂක මණ්ඩලය . . . . . 4
ආයතනික යහපාලනය . . . . . 5
අවදානම් කළමනාකරණය . . . . . 7
කළමනාකරණ සාකච්ජා හා විශ්ලේෂණ . . . . . 8
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ෂික වාර්තාව . . . . . 10
විගණන කමිටු වාර්තාව . . . . . 11

**මූල්‍ය ප්‍රකාශන**

ස්වාධීන විගණන වාර්තාව . . . . . 13
ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය . . . . . 15
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය . . . . . 16
ඒකාබද්ධ හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය . . . . . 17
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය . . . . . 18
මූල්‍ය ප්‍රකාශනවල සටහන් . . . . . 19
රැස්වීම කැඳවීමේ නිවේදනය . . . . . 34
ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘති පත්‍රය . . . . . 35
ආයතනික තොරතුරු . . . . . **පිටුපස කවරය ඇතුළත**

# සභාපතිගේ සමාලෝචනය

“සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්ව ආකෘතියක කොටස්කරුවන් වීමට විභව පෞද්ගලික ආයෝජකයන්ට දොරටු විවර කරනු ඇත. මෙම මුලපිරීමේ අරමුණ වන්නේ රාජ්‍ය වත්කම්වල සැබෑ වටිනාකම විවෘත කිරීම, මෙහෙයුම් හා මූල්‍ය කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, ශක්තිමත් ආයතනික පාලනයක් හා විදේශීය විනිමය උත්පාදනය කිරීම හා ඵලදායීත්වය වැඩි දියුණු කිරීම, වත්කම්වල ප්‍රශස්ත ප්‍රයෝජනය වැඩි දියුණු කිරීම සහ ජාතික ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් ලබා දීමේ අරමුණින් ලාභදායීත්වයට පරිවර්තනය කිරීමයි.”

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඔබ හමුවේ තැබීමට ලැබීම ගැන මම අතිශයින් සතුටට පත් වෙමි. ක්‍රියාකාරී හා ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහය හරහා පරිවර්තනයක් අවශ්‍ය වන ඌන ක්‍රියාකාරී සහ ඌන උපයෝගිතා වත්කම් ලෙස සැලකෙන හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් (හිල්ටන් කළම්බු), සිනෝ ලංකා රිසෝට් ඇන්ඩ් ස්පා ලිමිටඩ් (ග්‍රෑන්ඩ් හයිට්) සහ හොටෙල්ස් කළම්බු 1963 ලිමිටඩ් (ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල්) යන රජය සතු ප්‍රමුඛ සත්කාර වත්කම් පැවරීම සඳහා රජය සතු දේපළ සංවර්ධන ආයතනයක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා සිටීමට 2020 මාර්තු මාසයේදී මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය විසින් අමාත්‍යවරුන් වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය සංදේශයකට අනුව සමාගම සංස්ථාගත කරන ලදී.

ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමත් සමග ආයෝජකයන්ට හිතකර ආයෝජන වාතාවරණය සහ මූලික කරුණු සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර ආකෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබේ සමාගම හොඳින් ගමන් කර ඇති බව මම සටහන් කළ යුතුය. මෙම වසර තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබූ සැලසුම් පසෙක දැමීමට සමාගමේ මෙහෙයුම් වලට එරෙහිව ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම විශාල බාධාවක් විය. නඩු පැවැරීමෙන් ඇති වූ සෘණාත්මක හැඟීම්, ප්‍රගතිය අඩාල කර ඇත.

ව්‍යාපාර ආකෘතිය සහ අපේක්ෂිත අරමුණු ගොඩනැගීම සඳහා පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුත් සන්නිවේදන උපාය මාර්ගයක් මහජනතාවට ප්‍රදර්ශනය කර ඇති ඔබේ සමාගම මෙම දුෂ්කර කාල පරිච්ඡේද තුළ ධනාත්මක චේතනාවෙන් සියලූ අභියෝග සාර්ථකව ජය ගනු ඇතැයි මට විශ්වාසයි.

### මෙහෙයුම් සමාලෝචනය

සමාගමට එරෙහිව ගොනු කර ඇති දැනට පවතින මූලික අයිතිවාසිකම් පෙත්සමට අයත් වත්කම් කළඹේ අපේක්ෂිත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ නොවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය සඳහා සමාගම කිසිදු ආදායමක් උපයා නොගත් අතර එම පෙත්සම හේතුවෙන් පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් නීතිමය හා වෘත්තීය වියදම් සඳහා වැය වීමෙන් සමාගමට රුපියල් මිලියන 8.5 ක අලාභයක් දැරීමට හේතු විය. වත්කම් කළඹ විවිධාංගීකරණය කිරීම සඳහා අපේක්ෂිත අලෙවිකරණ ගාස්තු සමග නීතිමය කටයුතු සාර්ථකව අවසන් වූ පසු ඔබේ සමාගම ස්ථාවර ප්‍රකෘතියක් පෙන්නුම් කරනු ඇතැයි මට විශ්වාසයි. සීමිත කාර්ය මණ්ඩල ප්‍රතිපාදන සමග හවුල් සේවා සමග ඔබේ සමාගම පොදු කාර්ය වියදම් අවම කර ඇති බව ප්‍රශංසා කළ යුතුය.

## වසර තුළ ප්‍රධාන ජයග්‍රහණ

නීතිමය ක්‍රියාමාර්ග මගින් වල්ල වූ අභියෝග මැද වුවද අසීරු තත්වයකදී ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් හි මෘදු ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කිරීම සඳහා හොටෙල්ස් කළමිඹු (1963) ලිමිටඩ් හි කොටස් හිමියන්ට ඒත්තු ගැන්වීමට මූලපිරීමත් සමග සමාගම සිය මූලික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වේගය පවත්වා ගෙන ගියේය. උරුම ගෘහ නිර්මාණ ශිල්පයේ සැබෑ වටිනාකම හා අගුලූ හැරීම අගය වැඩි කර ඇති අතර එහි කාර්යසාධනය වෙනස් කර ඇත. 2021 ජූනි 20 වන දින හොස්පිටිලිටි ඇන්ඩ් ලෙෂර් හෝල්ඩින් SPV ලෙස සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සංස්ථාපිත කරන ලද්දේ වත්කම්වල සත්‍ය වටිනාකම ලබා ගැනීම සඳහා කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ අදහසින් විවේක හා සත්කාරක ව්‍යාපාරයේ වත්කම් කළඹ ඒකාබද්ධ කිරීමේ අදහසිනි. ගනුදෙනු උපදේශකවරයා පත් කර ඇත්තේ විවිධාංගීකරණය සඳහා වූ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ඵලදායී ලෙස සකස් කිරීම සඳහා විශේෂඥ දැනුම සහ උපදේශන සේවාව ලබා ගැනීම සඳහාය. ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ලබා දී ඇති වත්කම් කළඹවල සත්‍ය වටිනාකම විශ්ලේෂණය කිරීම හා හඳුනා ගැනීම සඳහා කීර්තිමත් ජාත්‍යන්තර උපදේශකයින් හරහා පුළුල් ශක්‍යතා අධ්‍යනයක් ද සමාගම විසින් ආරම්භ කර සම්පූර්ණ කරන ලදී. ප්‍රාග්ධනය සාර්ථකව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා විවිධාංගීකරණ ක්‍රියාවලිය සඳහා වත්කම් සකස් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දී ඇති කාල සීමාවන් තුළ අවසන් කරන ලදී. ග්‍රෑන්ඩ් හයට් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වන පිරිවැය රුපියල් බිලියන 60 සිට රුපියල් බිලියන 51 දක්වා අඩු කිරීමට සහ ව්‍යාපෘතියේ ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා අවම වශයෙන් 12%ක අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතයක් ලබා ගැනීම සඳහා විස්තීරණ වටිනාකම් ඉංජිනේරු ක්‍රියාවලියක් ද මෙයට ඇතුළත් වේ. සමාගම විසින් (1)ග්‍රෑන්ඩ් හයට් (2)හිල්ටන් කළමිඹු (3)ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් යන සත්කාරක වත්කම් තුන විවිධංගීකරණය සඳහා සුදුසු ආයෝජකයකු සොයා ගැනීමට තරඟකාරී ලංසු කැඳවීමක් පොදු වෙළඳ දැන්වීම් හරහා සිදු කල අතර එමගින් යහපාලනය සහ විනිවිදභාවය විදහා දැක්වීම සිදු කලද ශ්‍රී ලංකාව කෙරෙහි ආයෝජකයන්ගේ රුචිකත්වය වැඩි කිරීමට අයහපත් වෙළඳපොල තත්වයන් නිසා නොහැකි විය.

## ඉදිරි මග

එක් එක් වත්කම් කළඹ සඳහා අපේක්ෂිත විවිධාංගීකරණ සැලැස්ම සඳහා වූ ආයෝජන ප්‍රතිපත්ති රාමුව සම්බන්ධයෙන් රජයෙන් වැඩිදුර මගපෙන්වීම් අපේක්ෂා කරන අතර නීති මගින් පනවන සීමාවන් වෙනුවෙන් ආයෝජන පහසුකම් සපයන්නා ලෙස නියෝජනය අපේක්ෂා කරමු. නව ආදායම් මාර්ග නංවාලීම සඳහා අමතර ආදායමක් ගෙන ඒම සඳහා වෙනත් තාක්ෂණික වෘත්තීය සේවාවන් සැපයීමට ද සමාගම අදහස් කරයි. කොටස් බෙදා හැරීමේ උපායමාර්ගය සමග ඉදිරියට යාමට දිශානතිය ලබා ගැනීම පිළිබඳ සවිස්තරාත්මක අලෙවිකරණ සැලසුම් මෙම සමාගම අනුගමනය කරනු ඇත.

## ඇගයීම

සමාගමේ ආයෝජන උපායමාර්ග රාමුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග මගින් පනවා ඇති අභියෝග මැද මේ දක්වා ප්‍රගතිය ලගා කර ගැනීම සඳහා ප්‍රවේගයෙන් එම කාර්යය ඉටු කළ දක්ෂතම හා පළපරුදු කළමනාකරණ කණ්ඩායමේ අධිෂ්ඨානය සහ ධෛර්යය ගැන මම අතිශයින් ආඩම්බර වෙමි.

අභියෝග ජය ගැනීමට අපට උපකාර කිරීම සඳහා ඔවුන්ගේ කැපවීම සහ සහයෝගය වෙනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මුහුණ දී ඇති අභියෝග මැද වුවද ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපරිම සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යංශය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය ඇතුළු සියලූම පාර්ශ්වකරුවන්ට මම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

මුහුණ දී ඇති අභියෝග ජයගනිමින් ජාතික ආර්ථිකය පුනර්ජීවනය කිරීමට සහ ශ්‍රී ලංකාව වත්මන් ආර්ථික අර්බුධයට පෙර පුරෝකථනය කළ වර්ධන වේගයන් කරා ගෙන යාමට ප්‍රධාන කාර්යභාර්යක් ඉටු කරන ඌන ක්‍රියාකාරී සහ ඌන උපයෝගිතා රාජ්‍ය වත්කම් යළි පණගැන්වීමේ කොටස්කරුවන් වනු ඇතැයි මට විශ්වාසයි.



**P.A.I. සිරිනිමල් පෙරේරා**
සභාපති

# අධ්‍යක්ෂක මණ්ඩලය

**P.A.I. සිරිනිමල් පෙරේරා මහතා**
සභාපති

නාගරික සංවර්ධන හා නිවාස, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පිරිසිදුකම අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතාය. ඔහු 2007 සිට මේ දක්වා නොරිටාකේ ලංකා පෝසිලේන් ප්‍රයිවට් ලිමිටඩ් (නොරිටාකේ) හි අධ්‍යක්ෂක මණ්ඩලයේ විධායක උපදේශකයෙකු වන අතර කටුනායක IPZ හි පිහිටි ෂෝර් ටු ෂෝර් ප්‍රයිවට් ලිමිටඩ් නම් ලේබල් නිෂ්පාදනය, පෙට්ටි ඇසුරුම් කිරීම හා ඇඟලූම් නිෂ්පාදනයෙහි නිරත සමාගමක සභාපතිවරයා ද වේ. පෙරේරා මහතාට මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, අභ්‍යන්තර විගණනය හා සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වසර 30 කට වැඩි විධායක පළපුරුද්දක් ඇති අතර ජ්‍යෙෂ්ඨ විගණක හා ගණකාධිකාරිවරයෙකු ලෙස පිළිවෙලින් ආර්.කේ. ෆයර් වරලත් ගණකාධිකාරිවරුන් සමාගමේ සහ එක්සත් රාජධානියේ ඉන්ටර්නැෂනල් කම්පියුටර්ස් ලිමිටඩ්හි කටයුතු කර ඇත.

පෙරේරා මහතා නාගරික සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිත ආයතන වන ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලජිස් ලිමිටඩ්, ඔනාලි සමාගම, යුනිඩෙප් සමාගම, සීමාසහිත වෝටර්ස් එජ් සමාගම, ලංකා සෝල්ට් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස ද ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස ද කටයුතු කර ඇත. ඔහු සීමාසහිත ජිපල්ස් ලීසිං සමාගම, ඕෂන් වීව් සමාගම, ලංකා සෙරමික් ලිමිටඩ් සහ තවත් සමාගම් කිහිපයක අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද ඔහු 2018 වර්ෂයේ කෙටි කාලයක් තුල ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති ලෙස සේවය කර ඇත.

සිරිනිමල් පෙරේරා මහතා වරලත් හා සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (ACCA) (UK) අවසන් මට්ටම දක්වා ද එක්සත් රාජධානියේ ලූෂන් උසස් තාක්ෂණ විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.

පෙරේරා මහතා විද්‍යා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන තත්ත්ව හා ඵලදායිතා ප්‍රවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා සංගමය මගින් සිදු කරන ඉන්වෝල්මන්ට් ඕගනයිශේෂන් හි හොඳම සේවකයා සඳහා වන "හොඳම ප්‍රධාන විධායක" යන නාමයෙන් පිදුම් ලැබීය.

**M.T.I. විශාඛා අමරසේකර මහත්මිය**
අධ්‍යක්ෂිකා

අමරසේකර මහත්මිය රජයේ භාණ්ඩාගාරයේ වසර 15 කට වැඩි පළපුරුද්දක් ඇති හා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කරයි.

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරමින් විධායක නොවන අධ්‍යක්ෂකවරියක් ලෙස 2020 ජනවාරි 11 වන දින ලංකා බැංකු අධ්‍යක්ෂක මණ්ඩලයට ඇයව පත් කරන ලදී.

ඇය ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සහ මහජන බැංකුව ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂක මණ්ඩලවල රජයේ භාණ්ඩාගාරය නියෝජනය කර ඇත.

අමරසේකර මහත්මිය එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ වැන්ඩර්බිල්ට් විශ්ව විද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) සාමාජිකාවක් වන අතර වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරියක් ද වේ.

**P.A.S. අතුල කුමාර මහතා**
අධ්‍යක්ෂක

අතුල කුමාර මහතා 1991 වසරේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස රාජ්‍ය සේවයට එක් වූ අතර 2007 වසරේදී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට බැදුණි. වර්තමානයේ ඔහු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

ඔහු කොළඹ වාණිජ පොහොර, මන්තායි සෝල්ට් ලිමිටඩ්, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සිලෝන් ඇග්‍රි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, ලංකා හයිඩ්‍රොලික් ලිමිටඩ් හා සිලෝන් සෙරමික් කෝපරේෂන් ඇතුළු ව්‍යවස්ථාපිත ආයතන කිහිපයක අධ්‍යක්ෂක/ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ (රාජ්‍ය පරිපාලන) (විශේෂ) උපාධිධාරියෙකු වන අතර 2015 දී කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. අතුල කුමාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් රාජ්‍ය ගණකාධිකාරී සාමාජිකයෙකි.

**R.A. ලක්මින් උදය කුමාර මහතා**
අධ්‍යක්ෂක

උදය කුමාර මහතා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයෙකු වන අතර මහා භාණ්ඩාගාරයේ වසර 11 කට වැඩි පළපුරුද්දක් ඇති අතර එහිදී ඔහු රාජ්‍ය සතු ප්‍රධාන ව්‍යවසායන් අධීක්ෂණය සඳහා ක්‍රියාකාරිව සම්බන්ධ වී ඇත.

සේවක භාරකාර අරමුදල, පොල් පර්යේෂණායතනය, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය හා බුද්ධශාසන අරමුදල ඇතුළු විවිධ රාජ්‍ය ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඔහු සේවය කර ඇත.

ලක්මින් කුමාර මහතා මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඔහු කෙටිකාලීන උපදේශකයෙකු ලෙස ජත්‍යාන්තර මූල්‍ය සංස්ථාවේ සීමාවාසික පුහුණුවක් සමග ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන වෙළඳපොල වැඩසටහනක් ද සම්පූර්ණ කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය වන APFA හි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකි.

**රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා**
අධ්‍යක්ෂක

රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා දැනට නාගරික සංවර්ධන අධිකාරියේ විෂය පථය යටතේ ඇති පුළුල් ආහාර පාන සේවාවන් සහිත MICE දේපලක් වන සීමාසහිත වෝටර්ස් එජ් හි ප්‍රධාන විධායක නිලධාරියා වේ.

වෝටර්ස් එජ් හි පත්වීමට පෙර ප්‍රනාන්දුපුල්ලේ මහතා සිනමන් ලේක්සයිඩ් හි සාමාන්‍යාධිකාරී, සිනමන් හෝටල් සහ නිකේතන හි උප සභාපති, ගාලූ මුවදොර හෝටල් සමූහයේ හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, වෝටර්ස් එජ් හි සාමාන්‍යාධිකාරී හා කොළඹ හිල්ටන් හි විධායක සූපවේදී ලෙස සේවය කළේය.

ප්‍රනාන්දුපුල්ලේ මහතා වසර 40කට අධික කාලයක් දේශීය මෙන්ම ජාත්‍යන්තර අත්දැකීම් ඇති කීර්තිමත් සූපවේදියෙකි. විවිධ ගෝලීය සූපශාස්ත්‍ර තරග සඳහා තරග කරමින් ශ්‍රී ලාංකීය ආහාර පිසීම ජාත්‍යන්තර අවධානයට ලක් කිරීමට ඔහු සමත් වී ඇති අතර එහිදී ඔහු සිය සූපශාස්ත්‍ර ප්‍රවීණත්වය වෙනුවෙන් කීර්තිමත් සම්මාන කිහිපයක් දිනා ගන්නා ලදී. ප්‍රනාන්දුපුල්ලේ මහතා කොළඹ හිල්ටන් හි විධායක සූපවේදියෙකු වූ පළමු ශ්‍රී ලාංකිකයා ද විය.

ඔහු 2018 වසරේ හොටෙල් සප්ලයර් සගරාව විසින් පිරිනමන ශ්‍රී ලංකාවේ වසරේ හෝටල්කරුවාට හිමි සම්මානය ලත් සාඩම්බර හිමිකරුවෙකි.

**රෝහණ ද සිල්වා මහතා**
අධ්‍යක්ෂක (2022 මාර්තු 25 සිට පත් කරන ලදී)

රෝහණ ද සිල්වා මහතා කම්කරු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු ලෙස 2004 වසරේ රාජ්‍ය සේවයට එක් විය. 2006 සිට 2014 දක්වා ඔහු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම්වරයා වූ අතර 2014 සිට 2021 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා විය. දැනට ඔහු මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තනතුර දරයි.

ඔහු කැළණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ස්වභාවික විද්‍යාව පිළිබඳ අධ්‍යාපන උපාධියක් ලබා ඇත.

ඔහුට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය පරිපාලන හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රයක් ඇත.

# ආයතනික යහපාලනය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂක මණ්ඩලය යහපත් ආයතනික පාලන පිළිවෙත් අනුගමනය කිරීමේදී ඉහළ වැදගත්කමක් ලබා දෙන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ භාවිතයන් සංග්‍රහයට අනුකූලව ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට කැපවී ක්‍රියාකරන අතර 2021 නොවැම්බර් 16 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මගින් සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ අනුගමනය කරයි.

### අධ්‍යක්ෂක මණ්ඩලය

ආයතනික උපායමාර්ගික ඉලක්ක, සාරධර්ම හා ප්‍රමිතීන් සැකසීමේ වගකීම දරන ඉහළම පාර්ශ්වය වන සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කාර්යසාධන අධීක්ෂණය සහ සමාගම ඉහළ මට්ටමේ ආයතනික පාලනයක් පවත්වා ගෙන යන බවට සහතික වීම, වාර්තා කිරීම හා පාර්ශ්වකරුවන් කෙරෙහි ඇති වගකීම් සහ වගකීම් ඉටු කිරීම සඳහා විනිවිදබාවයක් පවත්වා ගෙන යාමට නායකත්වයක් සපයයි.

### අධ්‍යක්ෂක මණ්ඩල සංයුතිය

සමාලෝචිත වර්ෂය අවසානයේ දී ව්‍යාපාරයට සුදුසු නිපුණතා සහ පළපුරුද්ද සහිත විධායක නොවන අධ්‍යක්ෂකවරු 5 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වූ අතර ඒ පිළිබඳව විස්තරාත්මකව පහත දැක්වේ.

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා - ස්වාධීන විධායක නොවන

M.T.I. විශාඛා අමරසේකර මහත්මිය - ස්වාධීන නොවන හා විධායක නොවන

P.A.S. අතුල කුමාර මහතා - ස්වාධීන නොවන හා විධායක නොවන

R.A. ලක්මින් කුමාර මහතා - ස්වාධීන නොවන හා විධායක නොවන

රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා - ස්වාධීන විධායක නොවන

### අධ්‍යක්ෂකවරු පත්කිරීම

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව භාණ්ඩාගාර ලේකම්වරයාට වැඩි කොටස් ප්‍රමාණයක් හිමිවන අතර අධ්‍යක්ෂකවරුන්ගෙන් බහුතරයක් නම් කිරීමට හා පත් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට අයිතිය ඇත.

භාණ්ඩාගාර ලේකම් වෙත ලබා දී ඇති අයිතිවාසිකම්වලට අනුව එසේ පත් කරන ලද ඕනෑම පුද්ගලයෙකු ඉවත් කිරීමට සහ ඕනෑම පුද්ගලයෙකු වෙනුවට වෙනත් අයෙකු පත් කිරීමට හා කිසියම් හේතුවක් නිසා අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම නවත්වා කලින් පත් කරන ලද ඕනෑම පුද්ගලයෙකු ඉවත් කිරීමට අයිතිය ඇත. භාණ්ඩාගාර ලේකම්වරයා විසින් අධ්‍යක්ෂකවරුන් නම් කරන බැවින් ඔවුන් භ්‍රමණයෙන් විශ්‍රාම ගැන්වීමට යටත් නොවේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 210 හා 211 වගන්තිවල විධිවිධානවලට වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂකවරුන් යටත් වන අතර ඔවුන් වයස අවුරුදු 70 සම්පූර්ණ වූ පසු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා පමණක් නිලතල දරනු ඇති අතර සමාගම් පනතේ 211 වගන්ති ප්‍රකාරව නැවත පත් කරනු ලැබුවහොත් එම නැවත පත්කිරීම එම රැස්වීම්වලදී සමාගම් පනතේ 210 වගන්තියේ දක්වා ඇති වයස අවුරුදු 70 සීමාව එම අධ්‍යක්ෂකවරයාට අදාළ නොවන බව විශේෂයෙන් ප්‍රකාශ කරයි.

එම විධිවිධානවලට අනුව වයස අවුරුදු 70 ට වැඩි P.A.I. සිරිනිමල් පෙරේරා මහතා සභාපති නැවත පත් කර ඇත.

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ කිසිදු වෙනසක් සිදු නොවීය.

කෙසේ වෙතත්, වාර්තා කළ දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ පහත සඳහන් වකතු කිරීම් සිදු විය.

- 2022 මාර්තු 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි රෝහණ ද සිල්වා මහතා භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් කරන ලදී.

### අධ්‍යක්ෂක රැස්වීම්

සමාගමේ ප්‍රගතිය අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී නිතිපතා සලකා බලා සමාලෝචනය කරනු ලබන අතර එහිදී මණ්ඩලයේ අවධානය අවශ්‍ය වන වෙනත් ඕනෑම කරුණක් සමග සම්මත න්‍යාය පත්‍රයක් සාකච්ඡා කෙරේ. අධ්‍යක්ෂක මණ්ඩලය සෑම වසරකම අවම වශයෙන් පස් වතාවක් රැස්වන අතර අවශ්‍ය ඕනෑම තැනක මණ්ඩලයේ විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පහක් පැවැත්විණි. රැස්වීම්වලට සහභාගී වූ පිරිස මෙසේය.

| අධ්‍යක්ෂකවරුන්ගේ නම් | අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්වීම් ලද දිනය | 2021 වර්ෂය තුළ සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|
| P.A.I. සිරිනිමල් පෙරේරා මහතා | 03/07/2020 | 5/5 |
| M.T.I. විශාඛා අමරසේකර මහත්මිය | 03/07/2020 | 5/5 |
| P.A.S. අතුල කුමාර මහතා | 03/07/2020 | 5/5 |
| R.A. ලක්මින් කුමාර මහතා | 07/07/2020 | 4/5 |
| රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා | 07/07/2020 | 5/5 |

අධ්‍යක්ෂකවරුන් වෙත මාසික ප්‍රගති වාර්තා සහ ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශන හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී ගනු ලැබූ වැදගත් වන සියලුම තීරණ හා සාකච්ඡා කල කරුණු ලබා දෙනු ලැබේ. තවද, මණ්ඩලයේ නිශ්චිත අනුමැතිය අවශ්‍ය වන ගැටළු සම්බන්ධයෙන් වන මණ්ඩල පත්‍රිකා කල්තියා ඉදිරිපත් කරනු ලැබේ. සමාගම් ලේකම් විසින් සියලු රැස්වීම් වාර්තා මනාව සටහන් කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලබයි.

### සභාපති

අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති වන්නේ P.A.I. සිරිනිමල් පෙරේරා මහතාය. ඔහු මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, අභ්‍යන්තර විගණනය සහ සාමාන්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති පුද්ගලික හා රාජ්‍ය ආයතන රැසක අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කළ අයෙකි. ඔහු රැස්වීම්වලදී අධ්‍යක්ෂක මණ්ඩලයට මග පෙන්වන අතර සියලුම අධ්‍යක්ෂකවරුන් ඔවුන්ගේ හැකියාවන්ට අනුකූලව සමාගමේ ක්‍රියාකාරිත්වයට දායක වන බව සහතික කරයි.

### කළමනාකාරිත්වය

සමාගමේ දෛනික මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් යුත් ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත පවරා ඇත. අවදානම් හා අවස්ථාවන් හදුනාගෙන නිශ්චිත කාල රාමු හා අයවැය තුළ ඉලක්ක සපුරා ගැනීමට පියවර ගන්නා බව ඔවුන් සහතික කරයි.

# ආයතනික යහපාලනය

## අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණය

කොටස් හිමියන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධති හදුන්වා දීම සඳහා මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇත. මෙම අභිප්‍රාය ඇතිව සමාගම 2021 කාල සීමාව සඳහා විගණන ප්‍රඥප්තිය සහ සැලැස්ම සකස් කර ඇත. අභ්‍යන්තර පාලනයන්ට ආවේණික සීමාවන් ඇති බැවින් එය වංචා සහ වැරදිවලට එරෙහිව නිරපේක්ෂ සහතිකයක් ලබා නොදෙන බව මණ්ඩලය දැනුවත්ය.

## විගණන කමිටුව

විගණන කමිටුවේ සාමාජිකයන් පහත පරිදි වේ.

P.A.S. අතුල කුමාර මහතා - සභාපති (ස්වාධීන නොවන විධායක නොවන)

R.A. ලක්මින් කුමාර මහතා - සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන)

රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සහ හොටෙල් ඩිවලොපර්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් අතර ඇති කර ගත් සේවා ගිවිසුමට අනුව සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් විසින් සකස් කරන ලද හෝටල් මෙහෙයුම් අභ්‍යන්තර විගණන වාර්තාවල අභ්‍යන්තර පාලන පිළිබඳ වාර්තා සමාගමේ අභ්‍යන්තර විගණනයේ වගකීම හා විගණන කමිටුවට වාර්තා කිරීම සඳහා විගණන කමිටුව විසින් විමර්ශනය කර විශ්ලේෂණය කරයි. විගණන කමිටුව එවැනි වාර්තා මත පදනම්ව අවශ්‍ය /සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන අතර හෝටලයේ /සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති වැඩි දියුණු කිරීම් නිර්දේශ කරයි.

සමාගම ලැයිස්තුගත සමාගමක්ව සිටියදී අතුරු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය ඇතුළත්ව, විගණනය සඳහා නිකුත් කිරීමට පෙර විගණන කමිටුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි.

## වේතන කමිටුව

2021 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි වේතන කමිටුවේ වත්මන් සංයුතිය පහත පරිදි වේ.

## අධ්‍යක්ෂකවරුන්ගේ නම්

M.T.I. විශාඛා අමරසේකර මහත්මිය - සභාපති (ස්වාධීන නොවන විධායක නොවන)

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා - සාමාජික (ස්වාධීන විධායක නොවන)

P.A.S. අතුල කුමාර මහතා - සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන)

වේතන කමිටුව විසින් වේතන හෝ වේතන සම්බන්ධ කරුණු පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

## සමාගම් ලේකම්වරු

සමාගමේ ලේකම්වරුන් විසින් සමාගම් පනතට අදාළ කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් ලබා දෙන අතර එයින් හොඳම පාලන භාවිතයන් මණ්ඩලය හා එහි කමිටු විසින් යොදා ගන්නා බවට සහතික කරයි.

දැනට, සමාගම් පනත යටතේ සුදුසුකම් ලත් ලේකම්වරුන් වන පි.ඩබ්ලිව්.කෝපරේටි සෙකට්රියල් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ ලේකම්වරුන් වේ.

## නීතිමය අවශ්‍යතා සමග එකඟ වීම

සියලුම අධ්‍යක්ෂකවරුන්ට සමාගමේ මූල්‍ය හා කළමනාකරණ තොරතුරු වෙත ප්‍රවේශය ඇත. සමාගම නීති හා රෙගුලාසිවලට අනුකූල වන බව සහතික කිරීමට සහ සමාගමේ කටයුතු කළමනාකරණය කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්වීමට අධ්‍යක්ෂකවරු සෑම උත්සාහයක්ම දරති. මීට අමතරව මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලද යන්න සහතික කිරීම සඳහා පරීක්ෂා කිරීම් හා පාලනයන් ක්‍රියාත්මක වේ.

## මූල්‍ය හෙළිදරව් කිරීම් සහ විනිවිදබාවය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ සමාගම් පනතට අනුකූලව සකස් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වැනි සංශෝධනවලට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය සමග එක්ව කියවා ඇති පරිදි විගණකාධිපතිවරයා සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමාගමේ කළමනාකාරිත්වය හෝ මණ්ඩලයේ මැදිහත්වීමකින් තොරව ස්වාධීනව කටයුතු කිරීමට විගණකවරුන්ට අවසර ඇත. විගණකවරුන් වෙත පරීක්ෂණය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සපයනු ලැබේ.

## ආචාරධර්ම ප්‍රමිතීන්

සමාගම වෙනුවෙන් සියලුම සේවකයින් තම රාජකාරී සහ ගනුදෙනුවලදී අබණ්ඩතාවේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට කටයුතු කිරීම සමාගමට අවශ්‍ය වේ.

සමාගම සිය මෙහෙවර, දැක්ම, ඉලක්ක සහ වටිනාකම්වලට අනුකූලව ඉහළ මට්ටමේ ජයග්‍රහණ කරා ගෙන යන බලයලත් සහ පුහුණු කැපවූ සේවක පිරිසක් නිර්මාණය කිරීම සඳහා සේවකයින්ගේ පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර ඇත හෝ අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිපාදනය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ට අනුව සේවක ප්‍රතිලාභ (2006 සංශෝධිත) සඳහා ප්‍රතිපාදන සිදු කර ඇත.

## වගවීම හා හෙළිදරව් කිරීම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් විසින් සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට සෑහීමකට පත් වීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සවිස්තරාත්මකව සමාලෝචනය කර ඇති අතර මෙම පරිචයන් තුලින් ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිත සංග්‍රහය සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

## ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම

අධ්‍යක්ෂක මණ්ඩලය තම රාජකාරී ඉටු කිරීමේදී සමාගමේ වියදමින් අවශ්‍ය විටෙක බාහිර පාර්ශ්වයන්ගෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගනී.

**අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය අනුව,**
**සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්**



**පි.ඩබ්ලිව්. කෝපරේටි සෙකට්රියල් ප්‍රයිවට් ලිමිටඩ්**
අධ්‍යක්ෂක/ ලේකම්වරුන්

30 සැප්තැම්බර් 2022

# අවදානම් කළමනාකරණය

නොයෙකුත් අභියෝග මැද විවිධාංගීකරණය වූ වෙළඳපල ආකර්ෂණය කර ගැනීමේ සහ රඳවා ගැනීමේ ඉල්ලූම සමග ඉහළ තරගකාරී කර්මාන්තයක ඉදිරියෙන්ම සිටින සමාගම, දිගුකාලීන පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් ලබා දීමේදී අවදානම් කළමනාකරණය ඒකාබද්ධ ක්‍රියාවලියක් ලෙස සලකයි. ව්‍යතිරේකයට වඩා වෙනස් වීම සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ, ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සහ අනුකූලතාවය සමග උපායමාර්ගික සැලසුම් තුලනය කිරීමේදී සමාගම ඉටු කරන ප්‍රධාන භූමිකාව නිරන්තරයෙන් හදුනාගෙන ඇත. මෙමගින් තීරණ ගැනීමට සහ අවස්ථා හා ඒවායේ ආවේණික අවදානම් පිළිබඳව දැනුවත්ව ඇඟයීමට පහසුකම් සැලසෙන අතර, ප්‍රධාන වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීමට හෝ වැඩි දියුණු කිරීමට සමාගමට හැකිවේ.

අපගේ අවදානම් කළමනාකරණ වේදිකාව සමාගම තුළ ඇති අවදානම් වර්ග හදුනා ගැනීම, එම විභව අවදානම් මැනීම සහ ඒවා අවම කිරීම සහ පාලනය කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා යොමු වී ඇත. අවදානම් කළමනාකරණය අපගේ ආයතනික පාලන ව්‍යුහයේ සහ උපාය මාර්ගික සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර සමාගම විසින් ප්‍රමාණවත් බව සහ පිළිපැදීම සහතික කිරීම සඳහා කාලානුරූපී සමාලෝචන සමගින් සියලූම මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි සුදුසු පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සාර්ථකව සහ උපාය මාර්ගිකව ව්‍යුහගත කර ඇත.

අපගේ අවදානම් කළමනාකරණ රාමුව මෙහෙයුම් පරිසරයේ වෙනස් වන ගතිකතාවයන් නිරන්තරයෙන් පිළිබිඹු කරන අතර අපගේ ප්‍රතිපත්ති රාමු සහ අදාළ වන ජත්‍යාන්තර හොඳම භාවිතයන්ට අනුකූලව ගලපන ලද ඒවා වේ.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ රාමුව සඳහා අවසාන වගකීම දරයි. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියේ සමස්ත ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ කණ්ඩායම වගකිව යුතුය.

## අවදානම් කළමනාකරණ රාමුව

### වාණිජ හා ආර්ථික අවදානම්

- CSE හි ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ කොටස් මිලෙහි ප්‍රගතිශීලී වර්ධනයත් සමග ආගන්තුක සත්කාර කර්මාන්තයේ කොටස් අත්පත් කර ගැනීම සඳහා වර්තමාන වෙළඳපොල ඉල්ලූම විශාල ලෙස වැඩි දියුණු වී ඇත. කොටස් වෙන් කිරීම අවසන් කිරීම ප්‍රමාද වීම නිසා ආයෝජකයින්ගේ ආකර්ෂණය අඩු වී ඔවුන් වෙළඳපොලේ වෙනත් විකල්ප සොයා යන අතර ආකර්ශනීය මිල ගණන් සඳහා ඇති අවස්ථාව ද ගිලිහී යා හැක.
- රජය සතු ආගන්තුක සත්කාර වත්කම් ඉවත් කිරීමට පහසුකම් සැලසීමට සහ කඩිනම් කිරීමට සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සමාගම, රුපියල අවප්‍රමාණය වීමෙන් උපරිම විභව ප්‍රතිලාභ ලබා ගත යුතුය.
- තීරණ ප්‍රමාද වුවහොත් වෙනත් කලාපීය රටවල විදේශීය ආයෝජකයන්ට පවතින අවස්ථා අහිමි වී යාම.
- රජයේ ප්‍රතිපත්ති සමග පැහැදිලි අවබෝධයක්, ආයෝජකයින් වෙත වත්කම් අලෙවි කිරීමටත්, ආයෝජක විශ්වාසය ලබා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට සුදුසු වාතාවරණයක් නිර්මාණය කිරීමටත් සමාගමට වැදගත් වනු ඇත.
- නියමිත වේලාවට උපදෙස් ලබා නොදුනහොත් විදේශ විනිමය ආදායම වැඩි දියුණු කිරීමේ අවස්ථාව අහිමි වීමේ අවදානමක් පවතී.
- ඵලදායීතා වර්ධනය ඉහළ නැංවීමට හා ආර්ථික වර්ධන වේගය සඳහා පහසුකම් සැලසීමට රජය සතු කළඹ, කාලීන ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම.

### මූල්‍ය අවදානම්

- දිශානතියක් නොමැති විට සමාගමේ මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා කොටස් හිමියා විසින් මේ දක්වා දරන ලද මූල්‍ය අවදානම් පිරිවැය.
- සමාගම විසින් රජයේ වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් මාර්ගය උපරිම කර ගැනීමේ අවස්ථාව අහිමි කිරීම.
- ආයෝජන ඉහළ නැංවීමේ ප්‍රධාන අරමුණ ලෙස තවදුරටත් කළඹ ප්‍රතිව්‍යුහගත කිරීමට සමාගම සඳහා ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතයක් නොමැති වීම.

### නීතිමය අවදානම්

නීතිමය අවදානම යනු පුද්ගලයෙකුගේ හෝ සංස්ථාවේ ක්‍රියාවන්, අක්‍රියතාව, නිෂ්පාදන, සේවාවන් හෝ වෙනත් සිදුවීම් හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාවයි. නීතිමය අවදානම් ඉහළ මට්ටමක පවතින ප්‍රධාන ක්ෂේත්‍ර හදුනා ගැනීමට සහ එමගින් එම අවදානම් සීමා කිරීමට හෝ තුරන් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාවන් සාමාන්‍යයෙන් යම් ආකාරයක නඩු අවදානම් විශ්ලේෂණයක් හා කළමනාකරණයක් භාවිතා කරයි. ඒවා අධිකරණ බල ප්‍රදේශයෙන් අධිකරණ බල ප්‍රදේශයට විශාල ලෙස වෙනස් වේ.

- නීතිමය අවදානම යනු පුද්ගලයෙකුට හෝ සමාගමකට නීතිමය ක්‍රියාමාර්ගයකට මුහුණ දීමට සිදුවන අවදානමයි.
- මෙම නීතිමය ක්‍රියාමාර්ගය පුද්ගලයාගේ හෝ සමාගමේ සේවා, ක්‍රියා හෝ වෙනත් සිදුවීමක ප්‍රතිඵලයක් විය හැකිය.
- නීතිමය අවදානම තක්සේරු කිරීම සඳහා විය හැකි විසදුම් (උදා: බේරුම් කිරීම්) සහ නීත්‍යානුකූල ආරක්ෂාවක් සඳහා වන වියදම් බැලීම ඇතුලත් වේ.
- සමාගමක ආයෝජන ආයතන වෙනත් ව්‍යාපාරවලින් හෝ කොටස් හිමියන්ගෙන් පවා නීතිමය ක්‍රියාමාර්ග පැමිණිය හැකිය.

සමාගම විසින් නීති උපදේශකයින් පත් කර ඇති අතර ඕනෑම යෝජිත ආයෝජන උපාය මාර්ග, ප්‍රතිපත්ති රාමුවක් සහ අදාළ නීති සහ රෙගුලාසි සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් සහ ඉදිරියට යන ආකාරය පිළිබඳ නීතිමය මතයක් ලබා ගැනීම සහ යම් සංශෝධන හා යෝජනා සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම තුලින් යෝජිත ආයෝජන ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ උපදෙස් ලබා ගනී.

# කළමනාකරණ සාකච්ජා හා විශ්ලේෂණ

### කෙටි හැඳින්වීම

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් යනු 2020 මාර්තු මාසයේ දී ඌන ක්‍රියාකාරී සහ ඌන උපයෝගී කර ගත් රාජ්‍ය වත්කම් තනි හිමි සමාගමකට පැවරීමට ගත් කැබිනට් තීරණයට අනුව 2020 ජූලි මාසයේදී සංස්ථාපිත වූ ආයෝජන සහ දේපළ සංවර්ධන සමාගමකි.

සමාගමේ මූලික අරමුණ වනුයේ වත්කම් විභවය උපරිම කිරීමට සහ ඒවා ඵලදායී හා ලාභදායී ඒකක බවට පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP) කේන්ද්‍ර කර ගත් සුදුසු ප්‍රාග්ධන ව්‍යුහයක් හරහා මෙම වත්කම් ප්‍රතිව්‍යුහගත කිරීමයි.

### දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු

### දැක්ම

ගෝලීය පිළිගැනීමක් සහිත සක්‍රීය නිශ්චල දේපල කළඹ ආයෝජකයෙකු වීම.

### මෙහෙවර

- වත්කම් උපයෝජනය ප්‍රශස්ත කිරීම මගින් අපගේ කලඹට වටිනාකමක් එක් කිරීම.
- රජයේ යෝග්‍ය සහ ඵලදායී ආයෝජන ක්‍රමෝපායන් හරහා අපගේ දිගුකාලීන මූල්‍ය ඉලක්කය සාක්ෂාත් කර ගැනීම.
- මූලික ප්‍රතිපත්ති රටේ සමාජ ආර්ථික සංවර්ධනයට ධනාත්මක දායකත්වයක් ලබා දීම.

ඉලක්ක සහ අරමුණු

- ඌන ක්‍රියාකාරී සහ ඌන උපයෝගී කර ගත් රාජ්‍ය වත්කම් ඵලදායී හා ලාභදායී ඒකක බවට පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP) කේන්ද්‍ර කර ගැනීම.
- විදේශ විනිමය ගලා ඒම සහ තිරසාර ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- රැකියා අවස්ථා, ඵලදායීතාවය සහ දැනුම හුවමාරු කර ගැනීම තුළින් සමාජ ආර්ථික ප්‍රතිලාභ ඇති කිරීම.
- නිවැරදි ආයෝජක වාතාවරණයක් සහ විශ්වාසයක් ඇති කිරීම.

### ප්‍රගතිය 2022

වත්කම් කළඹ සංවර්ධනය සඳහා ශක්‍යතා වාර්තාව සකස් කිරීම උපදේශන සේවාවල පළමු අදියර ලෙස 2021 අප්‍රේල් 30 වැනි දින ඇක්සියුට් පාට්නර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලදී. ඇක්සියුට් පාට්නර්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් එක් එක් වත්කම් කළඹෙහි ව්‍යාපාරික වටිනාකම සහ ඉපැයීම් ආකෘතිය මත ඒකාබද්ධ කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහය තීරණය කරන ලෙස ඉල්ලා සිටියේය. ශක්‍යතා වාර්තාව අවසන් කර ඇති අතර වත්කම් කළඹ සඳහා ලබා ගත් තක්සේරුව, ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කොටස් තක්සේරුව තීරණය කරනු ඇත. ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය අමතර කාමර යතුරු සහිතව පුළුල් කිරීම සහ යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල සන්නාමගත නිවාස, විනෝදාස්වාදය, සාප්පු සවාරි සහ ආපනශාලා ඇතුළත් වන පරිදි සංවර්ධනය කිරීම පිළිබඳව වාර්තාව සලකා බලයි. හිල්ටන් හෝටල් හි හිල්ටන් කළම්බු ස්පෝර්ට්ස් සෙන්ටර් සංවර්ධනය කිරීමටත් වෙළඳ නාම සහිත හෝටල්, කාර්යාල අවකාශ, නිවාස සහ සිල්ලර අලෙවිසැල් සමග මිශ්‍ර සංවර්ධනයකට වාණිජ හා පදිංචිය සඳහා ප්‍රමුඛ ස්ථානයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට ඇතුළත් වේ.



### හිල්ටන් කළම්බු සහ ක්‍රීඩා මධ්‍යස්ථානය

හිල්ටන් කළම්බු ඇන්ඩ් ස්පෝර්ට්ස් සෙන්ටර් හි සංවර්ධනය සඳහා උනන්දුවක් දක්වන පුද්ගලික ආයෝජකයින් 4 දෙනෙකුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම් (EOI) කැඳවා ඇත.



### ග්‍රෑන්ඩ් හයට් කළම්බු

- මෑදු අලූත්වැඩියාවෙන් 60%ක් රු.බිලියන 25 ක වියදමකින් සිදු කර ඇති අතර එහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.බිලියන 51 කි.
- ව්‍යාපෘතිය සඳහා එක් ඉල්ලීම් කවයක් (RFP) ව්‍යාපෘතිය සඳහා සුදුසු ආයෝජකයෙකු සොයා ගැනීම සඳහා සම්පූර්ණ කර ඇත. අරමුදල් මූලාශ්‍ර ඔප්පු කිරීමට එකම ලංසුකරු අසාර්ථක වූ බැවින්, නව RFP ක්‍රියාවලියක් සැලසුම් කිරීමේ අදියරේ පවතී.
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, වත්කමේ ප්‍රධාන කොටස්කරුවා වන අතර බෙදාහැරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු අර්ධ වශයෙන් මූල්‍යකරණය කිරීමට එකඟතාවයක සිටී.



### ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල් (GOH)

මෑදු අලූත්වැඩියා අවසන් කර ඇත. පුද්ගලික ආයෝජකයෙකු තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා තෝරා ගෙන ඇත. නමුත් තෝරා ගත් හවුල්කරු වහාම ලංසු බැදුම්කර ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එබැවින් සුදුසු පුද්ගලික හවුකරුවෙකු සොයා ගැනීම සඳහා නව ලංසු තැබීමේ ක්‍රියාවලියක් යෝජනා කරයි.

දැනට GOH ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු වෝටර්ස් එජ් හි සහාය යටතේ ක්‍රියාත්මක වේ.

සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් 2021 ජූනි 20 වන දින හොස්පිටලිටි ඇන්ඩ් ලෙෂර් හෝල්ඩින් SPV ලෙස සංස්ථාපිත කරන ලද්දේ වත්කම්වල සත්‍ය වටිනාකම ලබා ගැනීම සඳහා කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ අදහසින් විවේක හා සත්කාරක ව්‍යාපාරයේ තෝරාගත් වත්කම් කළඹ ඒකාබද්ධ කිරීමේ අදහසිනි.

**සැලැස්ම 2023**

### ග්‍රෑන්ඩ් හයට් කළමිබු

- හෝටලයේ කොටස් සහ සංවර්ධන කටයුතු 100%ක් ග්‍රෑන්ඩ් හයට් විවිධාංගීකරණය සමග ඉදිරියට යාමට

- විකල්පයක් ලෙස, ප්‍රධාන කොටස්කරුවා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් (SLIC) අදියර 1 යටතේ වන කාමර 220 ක ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන රු.බිලියන 4ක් අරමුදල් ලබා ගැනීම.

### ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල් සහ යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල

100% බෙදාහැරීම සඳහා පුවත්පත් වෙළඳ දැන්වීම හරහා නව ලංසු යෝජනා කැඳවීමට කටයුතු කරයි.

### හිල්ටන් කළමිබු සහ ක්‍රීඩා මධ්‍යස්ථානය

- 100% බෙදාහැරීම සඳහා පුවත්පත් වෙළඳ දැන්වීම හරහා නව ලංසු යෝජනා කැඳවීමට කටයුතු කරයි.

- අමුත්තන්ගේ කාමර 253 ක් ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කිරීම

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ෂික වාර්තාව

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂක මණ්ඩලය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ එහි පරිපාලිත ආයතනවල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එම මූල්‍ය ප්‍රකාශනයන් අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන බවට තහවුරු කෙරෙන ස්වාධීන විගණන වාර්තාව සමගින් සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව කොටස් හිමියන් වෙත ඉදිරිපත් කිරීමට සතුටු වේ.

සමාගමේ කටයුතු පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ 2007 අංක 07 දරන සමාගම් පනතේ 168 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය තොරතුරු අඩංගු වේ.

### සාමාන්‍ය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් යනු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2020 ජූලි 3 වන දින සමාගම් ලියාපදිංචි අංක PB 00223687 යටතේ සංස්ථාපිත කරන ලද සමාගමකි.

### සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් යනු 2020 පෙබරවාරි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 20/0587/204/050 අනුව තෝරා ගත් රජය සතු සත්කාරක වත්කම් ඒකාබද්ධ කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සංස්ථාපිත රජය සතු ආයෝජන සමාගමකි.

සමාලෝචිත වර්ෂය තුල සමාගම එම ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැත.

### මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් P.A.I. සිරිනිමල් පෙරේරා මහතා (සභාපති) සහ A.B. රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා (අධ්‍යක්ෂක) විසින් නිසි පරිදි අත්සන් කරන ලද සමාගමේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත.

### විගණන වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග අමුණා ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සමාගම විසින් අනුගමනය කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල සටහන 4 හි දක්වා ඇත.

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 2,000,000 කින් නියෝජනය වන අතර වටිනාකම රු.20,000,000 ක් වේ.

### අධ්‍යක්ෂකවරයන්

ගිණුම් වර්ෂය අවසන් වන විට නිලතල දැරූ සමාගමේ අධ්‍යක්ෂකවරුන්ගේ නම් පහත දැක්වේ.

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා - සභාපති

P.A.S. අතුල කුමාර මහතා

M.T.I. විශාඛා අමරසේකර මහත්මිය

රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා

R.A. ලක්මින් උදය කුමාර මහතා

2022 මාර්තු 25 වන දින රෝහණ ද සිල්වා මහතා අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් කරන ලදී.

සාංගමික ව්‍යවස්ථාවලියේ 80 (i) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන් පත් කරන බැවින් ඔවුන් භ්‍රමණයෙන් විශ්‍රාම ගැන්වීමට යටත් නොවේ.

ඉහත අධ්‍යක්ෂකවරුන් කිසිවකු සමාගමේ කොටස් නොදරයි.

සීමාසහිත පූර්ණ හිමිකාරිත්වය දරන පරිපාලිත සමාගමක් වන සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හි ගිණුම් වර්ෂය අවසන් වන විට නිලතල දැරූ සමාගමේ අධ්‍යක්ෂකවරුන්ගේ නම් පහත දැක්වේ.

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා - සභාපති

M. ශමහිල් මොහිදීන් මහතා

### අධ්‍යක්ෂකවරුන්ගේ වේතන

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂකවරුන් කිසිදු වේතනයක් ලබා නොතිබුණි.

### සම්බන්ධතා රෙජිස්ටරය

2007 අංක 7 දරන සමාගම් පනතට අනුව සමාගම සම්බන්ධතා රෙජිස්ටරයක් පවත්වා ගෙන යයි. අධ්‍යක්ෂකවරුන් හා සම්බන්ධතා විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන් 12.1 හි අනාවරණය කර ඇත.

### පරිත්‍යාග

සමාලෝචිත වර්ෂය තුළ සමාගම කිසිදු පරිත්‍යාගයක් කර නොතිබුණි.

### විගණකවරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ 19 සහ 20 සංශෝධනවලට අනුව විගණකාධිපතිවරයා, සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකවරයාට ගෙවිය යුතු මුදල ලෙස විගණන ගාස්තු පමණක් රු.336,000 කි. අනුබද්ධ සමාගමක් වන සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සඳහා විගණන ගාස්තුවක් අය කර නොමැත.

### මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම්

සමාගමේ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කිරීම සඳහා එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීමකි. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂකවරුන් තහවුරු කරයි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ තත්ත්වය පිළිබඳ හා දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාඩුව මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බවට අධ්‍යක්ෂකවරුන් සෑහීමකට පත්වේ.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

තම දැනුම හා විශ්වාසය අනුව රජයට හා සමාගමේ සේවකයින්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා සිදු කර ඇති බවට අධ්‍යක්ෂකවරුන් සෑහීමකට පත් වේ.

### වාර්තා කරන දිනට පසුව සිදු වන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 09 හි දක්වා ඇති ඒවා හැර ගිණුම් වලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා කළ දිනට පසුව සිදු වී නොමැත.

මෙම වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලය නමින් හා වෙනුවෙන් අත්සන් කරනු ලැබුවේ,



**P.A.I. සිරිනිමල් පෙරේරා මහතා**
සභාපති



**M.T.I. විශාඛා අමරසේකර මහත්මිය**
අධ්‍යක්ෂක



**පී.ඩබ්ලිව්.කෝපරේටි සෙකට්රියල් ප්‍රයිවට් ලිමිටඩ්**
සමාගම් ලේකම්

30 සැප්තැම්බර් 2022

# විගණන කමිටු වාර්තාව

### විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති විධාන අනුව සමාගමේ කටයුතු සම්බන්ධ ඕනෑම කරුණක් පරීක්ෂා කිරීමට සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීමට හා අධීක්ෂණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස විගණන කමිටු ක්‍රියාත්මක වේ.

### විගණන කමිටුවේ කාර්යභාර්යය

විගණන කමිටුව තීරණ ගැනීමේදී මෙන් ම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට විසඳුම් සෙවීමේ ක්‍රියාවලියේදී හා මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකබව ආවරණයට අභ්‍යන්තර පාලන සඳහා නිසි පද්ධති ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට තම වගකීම් ඉටු කිරීමට සහාය වීම සඳහා ඵලදායී සංසදයක් ලෙස ක්‍රියා කරයි.

### විගණන කමිටුවේ සංයුතිය

විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

P.A.S. අතුල කුමාර මහතා දැනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් B.Sc කළමනාකරණ (රාජ්‍ය පරිපාලක) (විශේෂ) උපාධියක් ලබා ඇති අතර කොළඹවිශ්ව විද්‍යාලයෙන් MBA උපාධියක් ද ලබා ඇත. සුසන්ත කුමාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු වන අතර වරලත් රාජ්‍ය ගණකාධිකාරී සාමාජිකයෙකි.

R.A. ලක්මින් උදය කුමාර මහතා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු වන අතර මහා භාණ්ඩාගාරයේ වසර 11 කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි. ලක්මින් කුමාර මහතා මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන වෙළඳපොළ වැඩසටහනක් ද සම්පූර්ණ කර ඇති අතර IFC හි කෙටිකාලීන උපදේශකයෙකු ලෙස සීමාවාසික පුහුණුවක් ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ICASL හි ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය වන APFA හි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකි.

රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා සීමාසහිත වෝටර්ස් ඒජ් හි ප්‍රධාන විධායක නිලධාරී වේ. ප්‍රනාන්දුපුල්ලේ මහතා සිනමන් ලේක්සයිඩ් හි සාමාන්‍යාධිකාරී, සිනමන් හෝටල් සහ නිකේතන ආහාර පාන මුලපිරීම් හි උප සභාපති, ගාලූ මුවදොර හෝටල් සමූහයේ හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී හා කොළඹ හිල්ටන් හි විධායක සූපවේදී ලෙස සේවය කළේය.

### අභ්‍යන්තර විගණකවරුන්

සමාගම 2021 අප්‍රේල් මාසයේදී ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු බදවා ගන්නා ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සමාගම සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ විගණන කමිටුවේ නියමයන් සකස් කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් කළමනාකරණය විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කරන අතර අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආමන්ත්‍රණය කරන කාර්යයට වගකිව යුතු කාර්ය මණ්ඩලය විසින් පාලනයන් පිළිපැදීමේ තරම තීරණය කරයි. අභ්‍යන්තර විගණන වාර්තාවල සොයාගැනීම් සහ අන්තර්ගතය කළමනාකරණය සමග සාකච්ඡා කර නියමිත වේලාවට නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබන අතර එම වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

### බාහිර විගණකවරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත බලාත්මක කිරීමත් සමග විගණකාධිපතිවරයා සමාගමේ බාහිර විගණකවරයා ලෙස දිගටම කටයුතු කරයි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

### IFRS/SLFRS භාවිතය

සමාගම විසින් එහි මූල්‍ය ප්‍රකාශන මේ දක්වා සියලූම කාල පරිච්ඡේද සඳහා අදාළ වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත.

### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත සමාලෝචනය

සමාගමට අදාළ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන් සමග එක්ව සමාලෝචනය කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

ප්‍රධාන මූල්‍ය නිලධාරියා විසින් විගණන කමිටුවට අවශ්‍ය පරිදි තහවුරු කිරීම් සහ ප්‍රකාශන ලබා දෙන ලදී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කළ යුතු බවටත් සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ක්‍රියාකාරකම් හා වර්ෂය අවසන් දිනට සමාගමේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කිරීමටත් විගණන කමිටු සමාලෝචනය පහසුකම් සලසන ලදී.

### නිගමනය

සමාගමේ වත්කම් හා මූල්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් පාලනයක් ඇති බවත් විගණනය කරන ලද ගිණුම්වල අනාවරණය කර ඇති ප්‍රතිඵල කිසිදු ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් තොර බවත් විගණන කමිටුවේ අදහසයි.



**P.A.S. අතුල සුසන්ත කුමාර**
සභාපති - විගණන කමිටුව

මූල්‍ය ප්‍රකාශන

# ස්වාධීන විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAM/C/SIL/1/21/FA-1 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 15 August 2022

සභාපති

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සහ එහි පරිපාලිතයන්ගේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. සමූහයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරුයන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත්

# ස්වාධීන විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහසමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1.** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

**2.1.1.** 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2)වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලූ තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත්ව වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2.** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවයම් අඳාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**2.2.3.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4.** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3. වෙනත් කරුණු

2020 ජූලි 03 වැනි දින සමාගම සංස්ථාගත කරන ලද අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කර නොමැත.

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා | | සමූහය<br>මාස 12<br>31.12.2021<br>රු. | සමාගම<br>මාස 12<br>31.12.2021<br>රු. | <br>මාස 12<br>31.12.2020<br>රු. |
|---|---|---|---|---|
| ආදායම | | - | - | - |
| විකුණුම් පිරිවැය | | - | - | - |
| **දළ ලාභය** | | - | - | - |
| | | | | |
| ආයෝජන ආදායම | | **129,467** | **129,467** | - |
| වෙනත් ලැබීම් හා පාඩු | | - | - | - |
| පරිපාලන වියදම් | | **(8,377,940)** | **(7,529,804)** | (422,920) |
| බෙදාහැරීමේ වියදම් | | **(284,823)** | **(284,823)** | |
| | | | | |
| **මෙහෙයුම් ලාභය (පාඩුව)** | | **(8,533,296)** | **(7,685,160)** | (422,920) |
| ක්ෂය කිරීම් | | - | - | - |
| මූල්‍ය වියදම් | 01 | **(4,351)** | **(4,351)** | (405) |
| **බදු පෙර ලාභය / (පාඩුව)** | | **(8,537,647)** | **(7,689,511)** | (423,325) |
| | | | | |
| ආදායම් බදු වියදම් | | - | - | - |
| කාලසීමාව සඳහා බදු පසු ලාභය / (පාඩුව) | | **(8,537,647)** | **(7,689,511)** | (423,325) |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | |
| සේවක ප්‍රතිලාභ වගකීමෙහි සැබෑ ලාභය / (පාඩුව) | | - | - | - |
| **කාලසීමාව සඳහා මුළු විස්තීරණ ආදායම / (පාඩුව)** | | **(8,537,647)** | **(7,689,511)** | (423,325) |

මෙම මූල්‍ය ප්‍රකාශන තුල අනුකලන කොටසෙහි 1 සිට 14 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් දැක්වේ.

# ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| 2021 දෙසැම්බර් 31 දිනට | | සමූහය | සමාගම | සමාගම |
|---|---|---|---|---|
| | | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ පිරියත උපකරණ | | - | - | - |
| පරිපාලිතවල ආයෝජනය | | - | **10** | |
| මුළු ජංගම නොවන වත්කම් | | - | **10** | - |
| | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| තැන්පතු සහ ලැබිය යුතු මුදල් | 02 | **111,027** | **111,027** | |
| සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | 03 | **4,904,862** | **5,752,988** | - |
| නොනිමි ප්‍රාග්ධන කටයුතු - හොටෙල් කලම්බු (1963) ලිමිටඩ් (GOH) | | - | - | 1,453,750 |
| මුදල් හා බැංකු ශේෂය | 04 | **9,575,171** | **9,575,171** | 996,855 |
| **මුළු ජංගම වත්කම්** | | **14,591,060** | **15,439,386** | 2,450,605 |
| **මුළු වත්කම්** | | **14,591,060** | **15,439,196** | 2,450,605 |
| | | | | |
| **හිමිකම් හා වගකීම්** | | | | |
| **කොටස්හිමියන්ගේ ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 05 | **20,000,000** | **20,000,000** | 10 |
| සමුච්චිත අලාභය | | **(9,414,558)** | **(8,566,422)** | (423,325) |
| **මුළු හිමිකම** | | **10,585,442** | **11,433,578** | (423,315) |
| | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| මුළු ජංගම නොවන වගකීම් | | - | - | - |
| | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් | | **4,005,618** | **4,005,618** | 150,000 |
| කෙටි කාලීන ණය - හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් | | - | - | 2,500,000 |
| සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් | 06 | - | - | 223,900 |
| **මුළු ජංගම වගකීම්** | | **4,005,618** | **4,005,618** | 2,873,920 |
| **මුළු වගකීම්** | | **4,005,618** | **4,005,618** | 2,873,920 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **14,591,060** | **15,439,196** | 2,450,605 |

2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට මම සහතික වෙමි.

**සුදර්ශන් ශ්‍රී රයන්**
ප්‍රධානී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමක් වේ. 2022 ජූලි 4 දින මණ්ඩලය වෙනුවෙන් හා නාමයෙන් අත්සන් කරන ලදී.

**M.T.I. විශාඛා අමරසේකර**
අධ්‍යක්ෂිකා

**P.A.I. සිරිනිමල් පෙරේරා**
සභාපති

මෙම මූල්‍ය ප්‍රකාශන තුල අනුකලන කොටසෙහි 1 සිට 14 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් දැක්වේ.

# ඒකාබද්ධ හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන ලාභය | ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපන සංචිත | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | | | | | - |
| වර්ෂය තුල එකතු කිරීම් | 10 | | | | 10 |
| මාස 12 ක කාලසීමාව සඳහා ලාභය/(පාඩුව) | - | | | (423,325) | (423,325) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 10 | - | - | (423,325) | (423,315) |
| වර්ෂය තුල එකතු කිරීම් | 19,999,990 | | | | 19,999,990 |
| මාස 12 ක කාලසීමාව සඳහා ලාභය/(පාඩුව) | - | - | - | (7,689,511) | (7,689,511) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | (453,586) | (453,586) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000,000 | - | - | 8,566,422 | 11,433,578 |

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා සමූහය | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන ලාභය | ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපන සංචිත | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | | | | | - |
| වර්ෂය තුල එකතු කිරීම් | 10 | | | | 10 |
| මාස 12 ක කාලසීමාව සඳහා ලාභය/(පාඩුව) | - | | | (423,325) | (423,325) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 10 | - | - | (423,325) | (423,315) |
| වර්ෂය තුල එකතු කිරීම් | 19,999,990 | | | | 19,999,990 |
| මාස 12 ක කාලසීමාව සඳහා ලාභය/(පාඩුව) | - | - | - | (8,537,647) | (8,537,647) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | (453,586) | (453,586) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000,000 | - | - | (9,414,558) | 10,585,442 |

මෙම මූල්‍ය ප්‍රකාශන තුල අනුකලන කොටසෙහි 1 සිට 14 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් දැක්වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා | සමූහය | සමාගම | |
|---|---|---|---|
| | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | රු | රු | රු |
| බදු පෙර ලාභය / (පාඩුව) | **(8,537,647)** | **(7,689,511)** | (423,325) |
| | | | |
| **ගැලපීම්** | | | |
| පොලී වියදම් | **4,351** | **4,351** | - |
| පෙර වර්ෂයේ ගැලපීම් | **(453,586)** | **(453,586)** | - |
| පොලී ආදායම් | **(129,467)** | **(129,467)** | - |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | **(9,116,349)** | **(8,268,213)** | (423,325) |
| | | | |
| වැඩිවීම/අඩුවීම සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | **(4,904,862)** | **(5,752,998)** | - |
| වැඩිවීම/අඩුවීම තැන්පතු හා අත්තිකාරම් | **(100,000)** | **(100,000)** | |
| වැඩිවීම/අඩුවීම සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් | **(223,920)** | **(223,920)** | 223,920 |
| වැඩිවීම/අඩුවීම ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් | **3,855,618** | **3,855,618** | 150,000 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | **(10,489,513)** | **(10,489,513)** | (49,405) |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ** | | | |
| වැඩිවීම/අඩුවීම නොනිමි ප්‍රාග්ධන කටයුතු (GOH) | **1,453,740** | **1,453,740** | (1,453,750) |
| පොලී ආදායම් ලැබීම් | **118,440** | **118,440** | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **1,572,180** | **1,572,180** | (1,453,750) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ** | | | |
| කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීම | **20,000,000** | **20,000,000** | |
| පොලී සහිත ණය සහ ණය ගෙවීම් | **(2,500,000)** | **(2,500,000)** | 2,500,000 |
| මූල්‍ය වියදම් | **(4,351)** | **(4,351)** | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **17,495,649** | **17,495,649** | 2,500,000 |
| | | | |
| ශුද්ධ වැඩිවීම/අඩුවීම මුදල් හා මුදල් සමාන දෑ | **8,578,316** | **8,578,316** | 996,855 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **996,855** | **996,855** | - |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **9,575,171** | **9,575,171** | 996,855 |

මෙම මූල්‍ය ප්‍රකාශන තුල අනුකලන කොටසෙහි 1 සිට 14 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 1. සමායතනික තොරතුරු

### 1.1. සාමාන්‍ය

සීමාසහිත සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් පුද්ගලික සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත හා ලියාපදිංචි සීමිත බැරකම් සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මෙන්ට්ස් ලිමිටඩ් යනු 2020 පෙබරවාරි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක 20/0587/204/050 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව යෝජිත රජය සතු ආගන්තුක සත්කාර වත්කම් ඒකාබද්ධ කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සංස්ථාපිත රජය සතු ආයෝජන සමාගමකි. මෙම ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මෙන්ට්ස් නමින් සමාගමක් සංස්ථාපනය කර ඇත. දැනට පවතින මූලික අයතිවාසිකම් පෙත්සම් අංක 182/2021 හේතුවෙන් වර්ෂය තුළ කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සිදු නොවීය.

### 1.3. මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 ජූලි මස 04 වන දින බලය පවරන ලදි.

### 1.4. සමූහයේ තොරතුරු

සමූහය තුල අනුබද්ධ සමාගම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් වාර්ෂික වාර්තාවේ පරිපූරක තොරතුරු අංශය යටතේ ඇතුලත්කර ඇති සමූහ නාමාවලියෙහි විස්තර කර ඇත. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල ස්වභාවයෙහි සැලකියයුතු වෙනසක් සිදු නොවීය.

## 2. තක්සේරුව සඳහා පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ (ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්) 'ආදායම් ප්‍රකාශ' ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සාමාන්‍යයෙන් SLFRS/LKAS යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

### 2.2. තක්සේරුව සඳහා පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් පහත දැක්වෙන වැදගත් අයිතමයන් හැර සෙසු මූල්‍ය ප්‍රකාශ චේතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත:

- දේපළ, පිරියත හා උපකරණ පසුව සාධාරණ අගය අනුව තක්සේරු කරනු ලැබ ඇත.
- නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම පිළිබඳ බැරකම නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබ ඇත.

### 2.3. ක්‍රියාකාරී ව්‍යවහාර මුදල සහ ප්‍රදර්ශක ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති අතර එය සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල මෙන් ම ප්‍රදර්ශක ව්‍යවහාර මුදල ද වේ. අන්‍යාකාරයකින් ප්‍රකාශ කර නැත් නම් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සියලු ම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

### 2.4. ප්‍රධාන ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු

SLFRS/LKAS වලට අනුකූලව සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ, වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් සහ අවිනිශ්චිත තොරතුරු අනාවරණය කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ. වාර්තා කරන දිනයේ වගකීම්, විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වන්නේ චේතිහාසික අත්දැකීම් සහ දී ඇති තත්වයන් යටතේ සාධාරන යැයි විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මතය. සැබෑ ප්‍රතිඵල එකී ඇස්තමේන්තු සහ විනිශ්චය තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ ඒ හා බැඳුනු උපකල්පන අඛන්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදයේදී සහ ඒවා බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකදී ගිනුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන පිළිගනු ලැබේ.

### 2.5. තුලනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ LKAS 01 ක්‍රමවේදයට අනුකූලව සමාගම විසින් හැම විට ම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

### 2.6. වැදගත්කම සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ LKAS 01 ක්‍රමවේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශ තුළ දී සෑම වැදගත් සමාන අයිතම කාණ්ඩයක් ම වෙන වෙන ම දක්වා ඇත. වැදගත් නම් ස්වභාවය හෝ කාර්යයන් අනුව ගත් විට එකිනෙකට වෙනස් අයිතමයන් ද වෙන වෙන ම දක්වා ඇත.

හඳුනා ගත් අගයන් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක කරන ලද අයිතියක් ඇති සහ ශුද්ධ පදනමින් පියවා දැමීමේ හෝ වත්කම් උපලබ්ධි කොට ඊට සමගාමීව බැරකම පියවා දැමීමේ අපේක්ෂාවක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ශුද්ධ අගය වාර්තා කර ඇත. යම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර ලබා දී නැත්නම් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දී නිශ්චිත වශයෙන් අනාවරණය කෙරෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් හා වියදම් හිලව් කර නැත.

## 3. සකස් කිරීමේ පදනම

### 3.1. ඒකාබද්ධ කිරීම

#### 3.1.1. ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ('සමූහය' ලෙසින් හඳුන්වනු ලැබේ) 'ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය - SLFRS 10 ප්‍රකාරව සමාගමේ සහ එහි අනුබද්ධ ආයතනයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වන්නේය.

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහය ව්‍යාපාරයක නිර්වචනය සපුරාලන විට සහ පාලනය සමූහය වෙත පැවරෙන විට අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය ගිණුම් කටයුතු සිදු කරයි. කිසියම් ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයක් ව්‍යාපාරයක් ද යන්න තීරණය කිරීමේදී,

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

සමූහය විසින් අත්පත් කරගත් වත්කම් සහ ක්‍රියාකාරකම් සමූහයට අවම වශයෙන් අදාළ සහ සාරවත් ක්‍රියාවලියක් ඇතුළත් වේද යන්න සහ, අත්පත් කර ගත් ක්‍රියාකාරකම් සහ වත්කම් වලට ප්‍රතිපාදනයන් ලබාදීමේ හැකියාව තිබේද යන්න තක්සේරු කරනු ලැබේ.

### 3.1.2. ව්‍යාපාර සංයෝජනය

ව්‍යාපාරයක් හෝ වත්කම් සමූහයක් අත්පත් කරගෙන තිබේදැයි යන්න තක්සේරු කිරීමේදී 2020 අප්‍රියෙල් මස 01 වන දිනට හෝ ඉන් පසුව අත්පත් කර ගැනීමේ දිනයන් ඇති ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහ ව්‍යාපාරයක් යන අර්ථ දැක්වීම (SLFRS 03 සඳහා සංශෝධන ) යොදන ලදී. ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

ව්‍යාපාර සංයෝජන අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කිරීම සඳහා ගණන් ගනු ලැබේ - එනම්, පාලනය සමූහය වෙත මාරු කරන විට, පාලනය යනු ආයතනයක ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමේ බලයයි.

සමූහය අත්පත් කර ගැනීමේ දිනයේදී කීර්තිනාමය මැන බලනු ලැබේ:

* මාරු කරන ලද සාධාරණ වටිනාකමින් අඩු කළා

* හඳුනාගත හැකි වත්කම් වල ශුද්ධ පිළිගත් මුදල (සාමාන්‍ය සාධාරන වටිනාකම) සහ උපකල්පනය කරන ලද වගකීම්.

ඇතිවන ඕනෑම කීර්තිනාමයක් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂාකරනු ලැබේ. අතිරික්තය සෘණාත්මක වන විට, ලාභ හෝ අලාභයේදී මිලදී ගැනීම සඳහා කේවල් කිරීමේ ලාභයක් වහාම හඳුනාගනු ලැබේ. මාරුකිරීම සලකා බැලීමේදී පෙර පැවති සබඳතා සමථයකට පත් කිරීම සඳහා අදාළ මුදල් ඇතුලත් නොවේ. එවැනි මුදල් ප්‍රමාණයන් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගනු ලැබේ. ඕනෑම අවිනිශ්චිත සලකා බැලීමක් අත්පත් කරගත් දිනයේදී සාධාරන වටිනාකමකින් යුතුව මණිනු ලැබේ. මූල්‍ය උපකරණයක නිර්වචනයට අනුකූල වන අවිනිශ්චිත සලකා බැලීමක් ගෙවීමේ සම කොටස් ලෙස වර්ගීකරණය කර ඇත්නම්, එය ප්‍රතිමාණනය නොකරන අතර සම කොටස් තුල පියවීම සඳහා එය ගණන් ගනු ලැබේ. එසේ නොමැති නම්, අවිනිශ්චිත සලකා බැලීමේ සාධාරණ වටිනාකමේ පසුකාලීන වෙනස්කම් ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

### 3.1.3. අනුබද්ධ ආයතන

අනුබද්ධ ආයතන යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. අනුබද්ධිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශය, පාලනය ආරම්භ වූ දිනයේ සිට පාලනය නතර වන දිනය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වන්නේය.

### 3.1.4. පාලනය ගිලිහී යාම

පාලනය ගිලිහී යාම මත, අනුබද්ධිත ආයතනයේ වත්කම් සහ වගකීම්, පාලනය නොකරන ලද පොලී සහ අනුබද්ධිත ආයතනයට අදාළ කොටස් වල අනෙකුත් අවිනිශ්චිතතා සමූහය විසින් පිළිගනු නොලැබේ. පාලනය ගිලිහී යාම මත පැන නගින ඕනෑම අතිරික්තයක් හෝ හිඟයක් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගනු ලැබේ. පාලනය ගිලිහී ගිය විට කලින් අනුබද්ධිත ආයතනයේ රඳවා තබා ඇති ඕනෑම පොලී මුදලක් සාධාරණ වටිනාකමකින් මණිනු ලැබේ.

### 3.1.5. ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරන ලද ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අන්තර් සමූහ ශේෂයන් සහ ගනුදෙනු සහ, සමූහයේ අභ්‍යන්තර ගනුදෙනු වලින් පැන නගින ඕනෑම යථාර්ථවාදී නොවන ආදායම් සහ වියදම් ඉවත් කරනු ලැබේ. කොටස් ගිණුම්ගත ආයෝජකයින් සමඟ කරනු ලබන ගනුදෙනු වලින් පැන නගින සපුරා නොගත් ලාභ ආයෝජකයා කෙරෙහි සමූහයේ පවතින උනන්දුවට අනුව ආයෝජනයට එරෙහිව ඉවත්කරනු ලැබේ. සාක්ෂාත් කර නොගත් අලාභයන් ද සපුරා නොගත් ලාභ මෙන්ම ඉවත් කරනු ලබන නමුත් එසේ කරනුයේ හායනයන් පිළිබඳ සාක්ෂි නොමැති තාක් පමණකි.

### 3.1.6. වාර්තා කිරීමේ දිනය

සමූහයේ සියලුම අනුබද්ධිත ආයතන සහ කොටස් ගිණුම්ගත ආයෝජකතයින් සඳහා 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

### 3.1.7. විදේශ මුදල් ගනුදෙනු

සියලුම විදේශ මුදල් ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ ගනුදෙනු කරන දිනවල පවතින විනිමය අනුපාත වලට අනුකූලවය.

වාර්තා කරන දිනයේ විදේශ මුලද් වලින් සඳහන් කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම් එම දිනයේ විනිමය අනුපාතයට අනුකූලව දේශීය මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.

මුදල් අයිතමවල විදේශ මුදල් ලාභය හෝ අලාභය යනු, කාලසීමාව ආරම්භයේදී ශ්‍රී ලංකා රුපියල් වලින් ක්‍රමක්ෂ කළ පිරිවැය සහ, වාර්තා කරන කාල සීමාව අවසානයේදී, අදාළ කාලසීමාව තුල ඵලදායී පොලී සහ ගෙවීම් සඳහා සකස් කරන ලද විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කරන ලද විදේශ මුදල් වල ක්‍රමක්ෂ කළ පිරිවැය අතර වෙනස වන්නේය.

## 4. ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගම හැම විටම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් 4.1 සටහන තුළ ප්‍රකාශ කර ඇති වෙනස් වීම් හැරුණු විට ඒවා පූර්ව වර්ෂයේ දී යොදා ගත් ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

### 4.1. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනාවරණය කිරීම් සම්බන්ධයෙන් සිදු වූ වෙනස් වීම්

නව හා සංශෝධිත ප්‍රමිතීන් හා අර්ථ නිරූපණ

#### SLFRS 16 - කල් බදු දීම්

SLFRS 16 තනි බදු ගැනුම්කරු පිළිබඳ ගිණුම්කරණ ආකෘතියක් සම්පාදනය කරන අතර කල් බදු කාල සීමාව මාස 12 හෝ ඊට අඩු නොවේ නම් හෝ බදු දීමනාකරුගේ ගිණුම්කරණ භාවිතය වර්තමාන භාවිතයට සමාන වුවද පාදක වත්කමට තිබෙන්නේ අඩු වටිනාකමක් නම්, කල් බදුවල දී සියලු කල් බදු සම්බන්ධයෙන් වත්කම් හා බැරකම් හඳුනා ගැනීමේ අවශ්‍යතාවය මතු කරයි. මෙමගින්: LKAS 17 කල් බදු, යම් සැලසුමක් කල් බද්දකින් සමන්විත වන්නේ දැයි තීරණය කරන IFRIC 4, SIC 15 කල් බදු - දිරි ගැන්වීම් ක්‍රියාවට නැංවීම සහ කල් බද්දක නෛතික ස්වරූපය සහිත ගනුදෙනුවල ස්ථාවරත්වය තක්සේරු කරන SIC 27

අවලංගු වේ. ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා 'ගිවිසුම්' කරණ කොට ගෙන SLFRS 15 'ආදායම' අදාළ වන ආයතනවලට කල් තියා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

"2019 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා SLFRS 16 බලපවත්වයි.

## 4.2. වැදගත් ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අනාගතය සම්බන්ධයෙන් ඇතැම් විචක්ෂණ ගිණුම්කරණ උපකල්පන යොදා ගැනීමට සිදු වේ. එපමණක් නොව වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ ආදායම, වියදම, වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාගත අගයන්ට සහ අසම්භාව්‍ය බැරකම් අනාවරණයට බලපාන තීන්දු ගැනීමට, ඇස්තමේන්තු සිදු කිරීමට සහ උපකල්පනවලට එළඹීමට ද එහි දී කළමනාකාරිත්වයට සිදු වේ. කෙසේ වුව ද මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිත භාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදවල දී වත්කමේ හෝ බැරකමේ ධාරණ අගයෙහි සැලකිය යුතු ගැළපීම් කිරීමට සිදු විය හැකි ය. එම නිසා සැබෑ අත්දැකීම හා ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකි ය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකාරිත්වය පහත දැක්වෙන තීන්දු ගැනීම්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනවලට එළඹීම් සිදු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශවල දී හඳුනා ගැනෙන අගයන්ට වඩාත් ම සැලකිය යුතු බලපෑම ඇති වී තිබෙන්නේ ඒවායිනි:

### a) බදුකරණය

ආදායම් බදුවලට සහ අගය එකතු කළ බදුකරණය (වැට්) හා ජාතිය ගොඩ නැගීමේ බද්ද ඇතුළු වෙනත් බදුවලට සමාගම යටත් වේ. මූල්‍ය ප්‍රකාශවල දී SLFRS ප්‍රමිතීන් යොදා ගැනීම පිළිබඳව සලකා බැලීම සම්බන්ධයෙන් බදු මාර්ගෝපදේශ නිකුත් කෙරෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් වෙන් කළ යුතු මුළු ප්‍රතිපාදනය සහ බදු පැනවීම හේතු කොට ගෙන බදු ගෙවීමට සිදු වන ලාභය නිශ්චය කිරීම සඳහා වැදගත් තීන්දු ගැනීමට සිදු විය. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලද කාල වකවානුවේ දී බදු නීතිවල අදාළත්වය පිළිබඳ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පැවතිණ.

අතිරේක බදු ගෙවීමට සිදු වේ ද යන්න පිළිබඳ ඇස්තමේන්තු පදනම් කර ගෙන සමාගම විසින් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදුවලට අදාළව වත්කම් හා බැරකම් හඳුනා ගනු ලැබිණ. අවසන් බදු ප්‍රතිඵලය මුල දී වාර්තාගත අගයන්ගෙන් වෙනස් වන අවස්ථාවල දී එම වෙනස හේතු කොට ගෙන තීරණය ගන්නා කාල පරිච්ඡේදයට අදාළ ආදායමට සහ විලම්බිත හා වෙනත් බදු අගයන්ට බලපෑමක් ඇති වනු ඇත.

### b) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමාගමේ දේපළ, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ අගය අනුව පිළිබිඹු කරනු ලැබේ. සමාන වත්කම්වල වර්තමාන වෙළඳ පොළ මිල ගණන් ලබා ගත හැකි අවස්ථාවල දී මෙම වත්කම්වල සාධාරණ අගයන් ඇස්තමේන්තු කිරීමේ දී එවැනි සාක්ෂි සලකා බලනු ලැබේ. එවැනි තොරතුරු නොමැති අවස්ථාවල දී සමාගම ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවෙකුගේ සහාය ඇතිව යුක්ති සහගත සාධාරණ අගයන් පිළිබඳ ඇස්තමේන්තු පදනම් කර ගෙන සාධාරණ අගයන් ලෙස ආරෝපණය කළ හැකි අගයන් තීරණය කරයි.

### c) දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමාගම සෑම වාර්තාකරණ දිනයක දී ම ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාලයන් සහ වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සමාලෝචනය කරයි. කළමනාකාරිත්වය විසින් තීන්දු ගනු ලබන්නේ මෙම අගයන්, අනුපාතිකයන් හා ක්‍රමවේදයන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය තුළ දී බැවින් ඒවා අවිනිශ්චිතතාවට බඳුන් වේ.

### d) අඛණ්ඩ භාවය

සමාගම ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කර ඇති අතර පෙරදැකිය හැකි අනාගතයේ දී සිය ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතුව තිබෙන බවට ඔවුහු සෑහීමකට පත්ව සිටිති. එපමණක් නොව ව්‍යාපාරයක් ලෙස සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව යම් සැකයක් ජනිත කරවන කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා අතර සමාගමේ කටයුතු ඈවර කිරීමේ හෝ මෙහෙයුම් කටයුතු නතර කිරීමේ අපේක්ෂාවක් ඔවුන්ට නැත. එම නිසා තව දුරටත් ව්‍යාපාරයේ අඛණ්ඩතාව පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

### e) මූල්‍ය වත්කම් මත ඌනකරණ අලාභ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කළ යුතු ඌනකරණ අලාභයක් සිදුව ඇත් දැයි නිශ්චය කිරීම සඳහා වාස්තවික සාක්ෂි පවතී දැයි සමාගම වී වී වාර්තාකරණ දිනයේ දී හෝ වඩාත් නිරන්තරව තක්සේරු කර බලයි.

### f) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලැබේ. ආයුගණක තක්සේරුවල දී එළඹෙන විවිධ උපකල්පනයන් අනාගතයේ දී සැබවින් සිදු වන වර්ධනයන්ට වඩා වෙනස් විය හැකි ය. වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වැඩි වීම්, මරණ අනුපාතික යනාදිය තීරණය කිරීම මෙම උපකල්පන අතරට ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණතාව, පදනම් කර ගන්නා උපකල්පන සහ ඒවායේ දීර්ඝ කාලීන ස්වභාවය නිසා මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම් හේතු කොට ගෙන නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම් බෙහෙවින් වෙනස් වේ. සියලු ම උපකල්පන සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනය කරනු ලැබේ.

යෝග්‍ය වට්ටම් අනුපාතිකය තීරණය කිරීමේ දී කළමනාකාරිත්වය නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ අපේක්ෂිත කාල පරිච්ඡේදයට අනුරූප බහිර්නිවේශිත කල් පිරීම් සහිත ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් උපයා ගත හැකි ආදායම සලකා බලයි. මරණ අනුපාතිකය ගණනය කරනු ලබන්නේ ප්‍රසිද්ධ කර ඇති මරණ ප්‍රමාණ දැක්වෙන වගු පදනම් කර ගනිමිනි. අනාගත වැටුප් වැඩි වීම් ගණනය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතික සහ සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධන අනුපාතික පදනම් කර ගනිමිනි.

## 5. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සමාගම විසින් අදාළ කර ගැනෙන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති අතරට

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

පහත දැක්වෙන ප්‍රතිපත්ති ඇතුළත් වේ. අන්‍යාකාරයකින් දක්වා නැත් නම් මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේද සඳහා හැම විට ම පහත විස්තර කෙරෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

## 5.1. ආදායම් හඳුනා ගැනීම

### (i) ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම

හෝටලය සත්කාරක සේවාවන් සහ විවේකය ආශ්‍රිත සේවාවන් සම්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටියි.

භාණ්ඩ හා සේවාවන් සඳහා නුවමාරු වශයෙන් හිමි විය යුතු යැයි හෝටලය අපේක්ෂා කරන මුදල පිළිබිඹු වන අගයක් මත භාණ්ඩ හෝ සේවාවන් පිළිබඳ පාලනය ගනුදෙනුකරුවා වෙත පැවරෙන විට ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම් වලින් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

ගනුදෙනුකරුවා වෙත පැවරීමට පෙර භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය නිසි පරිදි සිදු වන නිසා සිය ආදායම් විධිවිධානවල මූලධර්මය වය විය යුතු බවට හෝටලය පොදු නිගමනයකට එළඹ ඇත.

SLFRS 15 අදාළ කර ගැනීමෙන් ඇති වන බලපෑම කළමනාකාරිත්වය විසින් පහත අනාවරණය කෙරෙන පරිදි තක්සේරු කරනු ලැබ ඇත:

### (a) සේවා සම්පාදනය

යම් කාල පරිච්ඡේදයකට අදාළ සේවා සම්පාදන කාර්ය සාධන බැඳීම් සැපිරෙන විට සේවා සම්පාදනයෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

වාසය කරන කාමර ගණන අනුව කාමර ආදායම දෛනික පදනමකින් හඳුනා ගනු ලබන අතර ආහාර පාන ආදායම ඒවා අලෙවි කරන මොහොතේ දී ම (එනම් කාර්ය සාධන බැඳීම සැපිරෙන අවස්ථාවේ දී ම) ගණනය කරනු ලැබේ.

### (ii) පොලිය

සියලු මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ෂය පිරිවැය සහ අලෙවිය සඳහා පවත්නා බවට වර්ග කෙරෙන පොලී සහිත මූල්‍ය වත්කම් අනුව තක්සේරු කිරීම සඳහා පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාතිකය (EIR) යොදා ගනිමින් වාර්තාගත කෙරෙන අතර මූල්‍ය සාධන පත්‍රයේ අපේක්ෂිත ජීව කාලය යොදා ගනිමින් හෝ අදාළ අවස්ථාවල දී වඩාත් කෙටි කාල පරිච්ඡේදයක් සඳහා මූල්‍ය වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරණ අගය යොදා ගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිශ්චිත වශයෙන් වට්ටම් කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකය පදනම් කර ගනිමිනි. මූල්‍ය නොවන වත්කම්වලින් ලැබෙන පොලී ආදායම ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ (FF&E) සංචිතයට ඇතුළත් කරනු ලැබේ. අනෙක් සියලු පොලී ආදායම් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ.

### (iii) කඩ කුලී ආදායම

කඩ කුලී ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

### පිරිවැටුම පදනම් කර ගත් බදු

පිරිවැටුම පදනම් කර ගත් බදු අතරට අගය එකතු කළ බද්ද, ජාතිය ගොඩ නැගීමේ බද්ද සහ සංචාරක කර්මාන්ත සංවර්ධන බද්ද ඇතුළත් වේ. හෝටලය අදාළ ආයතනික නීතිරීතිවලට අනුකූලව එවැනි බදු ගෙවයි.

### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

## 5.2. වියදම් හඳුනා ගැනීම

දැරූ පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කර ගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී වියදම් හඳුනා ගනු ලැබේ. ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා දැරූ සියලු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ කාර්ය සාධන මූලිකාංග ප්‍රමාණවත් ලෙස නිරූපණය වන්නේ ය යන පදනම මත "වියදම් ශ්‍රිතය" විධික්‍රමය උපයෝග කර ගෙන ඇත.

ආදායම් බදු වියදම ප්‍රවර්තන හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

## 5.3. බදුකරණය

### 5.3.1. ප්‍රවර්තන බද්ද

ප්‍රවර්තන බදු වත්කම් හා බැරකම් සමන්විත වන්නේ ප්‍රවර්තන වර්ෂයට අදාළව සහ පූර්ව වර්ෂ සඳහා ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් කර ඇති කවර හෝ ගැළපීමකට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අය කර ගැනීමට හෝ ඔහුට ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණවලිනි. වාර්තා කරන දිනට පනවා ඇති හෝ සාරානුකූලව පනවා ඇති බදු අනුපාතික හා බදු නීති යොදා ගෙන මුදල් ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

### 5.3.2. විලම්බිත බද්ද

වාර්තාකරණ කාල පරිච්ඡේදයේ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ බැරකම් විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා විලම්බිත බදු හඳුනා ගනු ලැබේ.

අඩු කළ හැකි සියලු වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලැබේ. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලින් සහ අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාමෙන් ප්‍රයෝජන ගත හැකි වන පරිදි බදු අය කළ හැකි ලාභ පැවතීමට ඇති සම්භාවිතාවේ ප්‍රමාණයට පමණක් අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සිදු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර සම්පූර්ණ විලම්බිත බදු වත්කම හෝ එහි යම් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තව දුරටත් පැවතීමේ සම්භාවිතාවක් නොමැති වන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයක දී ම නැවත තක්සේරු කෙරෙන අතර ඉදිරියේ දී බදු අය කළ හැකි ලාභ මගින් විලම්බිත බදු වත්කම නැවත අය කර ගැනීමට ඉඩ සැලසෙන සම්භාවිතාවේ ප්‍රමාණයට හඳුනා ගනු ලැබේ.

වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ තදනන්තරව පනවනු ලබන බදු අනුපාතික හා බදු නීති පදනම් කර ගෙන සහ වත්කම් උපලබ්ධි වන

විට හෝ බැරකම් පියවෙන විට වසර තුළ දී අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතිකය අනුව විලම්බිත බදු වත්කම් හා බැරකම් තක්සේරු කරනු ලැබේ.

## 5.4. මූල්‍ය නොවන වත්කම්

### 5.4.1. දේපළ, පිරියත හා උපකරණ

#### a) හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

**ආරම්භක හඳුනා ගැනීමේ දී**

වත්කම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ වත්කමේ පිරිවැය LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුකූලව තක්සේරු කළ හැකි වීමේ සම්භාවිතාව අනුව දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගනු ලැබේ. සමුච්චිත ක්ෂය කිරීමක් හෝ සමුච්චිත ඌනකරණ අලාභයක් සිදු වී ඇත් නම් ආරම්භයේ දී දේපළ හා උපකරණ තක්සේරු කරනු ලබන්නේ එම ක්ෂය කිරීම සහ අලාභය නිසා දැරීමට සිදු වූ ශුද්ධ පිරිවැය අනුව ය. හඳුනා ගැනීමේ නිර්ණායක සැපිරෙන්නේ නම් එවැනි පිරිවැය අතරට ඇතුළත් වන්නේ ප්‍රතිස්ථාපනය කළ දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා දැරූ පිරිවැය සහ දීර්ඝ කාලීන ඉදි කිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීම නිසා දැරූ පිරිවැය යි. කාල ප්‍රාන්තරයෙන් ප්‍රාන්තරයට දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු තරමේ කොටස් ප්‍රතිස්ථාපනය කිරීමට සිදු වන විට සමාගම එවැනි කොටස් විශේෂිත ප්‍රයෝජනවත් ජීව කාලයන් සහිත තනි වත්කම් ලෙස හඳුනා ගන්නා අතර ඒ අනුව ඒවායේ අගය ක්ෂය කරයි. එමෙන් ම විශාල ප්‍රතිසංස්කරණයක් සිදු කෙරෙන විට හඳුනා ගැනීමේ නිර්ණායක සැපිරෙන්නේ නම් එහි පිරිවැය දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගය තුළ දී ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙක් සියලු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැයවල් ඒවා දරනු ලබන පරිදි ලාභය හෝ අලාභය තුළ දී හඳුනා ගනු ලැබේ.

**තදනන්තර තක්සේරුවේ දී**

සියලු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය කිරීම අඩු කර සාධාරණ අගය මත තදනන්තරව තක්සේරු කෙරෙන අතර එවැනි තක්සේරු සිදු කරනු ලබන්නේ බාහිර ස්වාධීන තක්සේරුකරුවන් විසිනි. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් බෙහෙවින් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් නිරන්තරතාවකින් යුතුව තක්සේරු සිදු කරනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම්වල දී ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගැනෙන අතර ස්කන්ධයේ දී එය ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. කෙසේ වුව ද ආදායම් ප්‍රකාශයේ දී එම වත්කමට අදාළව කලින් හඳුනා ගන්නා ලද ප්‍රත්‍යාගණන හිඟයක් එය විසින් ප්‍රතිවර්තනය කෙරෙන තාක් දුරට ආදායම් ප්‍රකාශයේ දී වැඩි වීමක් හඳුනා ගනු ලැබේ. වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ දී එම වත්කම සම්බන්ධයෙන් හඳුනා ගැනෙන පවත්නා අතිරික්තයක් එය විසින් හිලව් කෙරෙන තාක් දුරට මිස ප්‍රත්‍යාගණන හිඟයක් හඳුනා ගනු ලබන්නේ ලාභය හෝ අලාභය තුළ දී ය. බැහැර කිරීම හෝ හඳුනා ගැනීම ඉවත් කිරීම මත එම වත්කමට අදාළ යම් ප්‍රත්‍යාගණන සංචිතයක් විකුණා දැමෙන්නේ නම් එම සංචිතය රඳවා ගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

වත්කම්වල ප්‍රත්‍යාගණනය කළ ධාරණ අගය මත පදනම්ව කරනු ලබන ක්ෂය කිරීම සහ වත්කම්වල මූලික පිරිවැය මත පදනම්ව කරනු ලබන ක්ෂය කිරීම අතර වෙනස අත් කර ගැනීම සඳහා වාර්ෂික පදනමකින් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවා ගත් ඉපැයුම්වලට මාරු කිරීමක් සිදු කරනු ලැබේ.

**තදනන්තර පිරිවැය**

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ශක්තිය වර්ධනය කිරීම පිණිස ස්ථාවර ස්වභාවයේ වත්කම් අත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා තදනන්තරව දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන අතර එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ දී හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල දෛනික සේවාකරණය ආශ්‍රිත පිරිවැයවල් ඒවා දරනු ලබන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

**ක්ෂය කිරීම**

දේපළේ සහ උපකරණයේ පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයන් අනුව ඒවායේ ශේෂ අගයන් දක්වා අඩු කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය යොදා ගනිමින් ක්ෂය කිරීම ගණනය කරනු ලැබේ. මිල දී ගත් දින සිට බැහැර කරනු ලබන දින දක්වා ප්‍රමාණානුකූල පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයන් මත පදනම්ව ක්ෂය කිරීම් සිදු කරනු ලබන අනුපාතික පහත දැක්වේ:

| වත්කම් වර්ගය | % |
|---|---|
| ගොඩනැගිලි | 2.5 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 7.5 |
| ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ | 7.5 |
| පරිගණක හා රූපවාහිනී | 20 |
| මෝටර් රථවාහන | 25 |
| ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ | 10 |
| මෙහෙයුම් උපකරණ | 33 |

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම වත්කමේ ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය කිරීමේ විධික්‍රමය සමාලෝචනය කර අවශ්‍ය නම් ගැළපීම් සිදු කරනු ලැබේ.

**හඳුනා ගැනීම ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම මත හෝ භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකෙරෙන විට ඒවා හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කිරීම නිසා ඇති වන යම් ලාභයක් හෝ අලාභයක් වේ නම් (ශුද්ධ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් සහ වත්කමේ ධාරණ අගය අතර පවත්නා වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ හඳුනා ගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 5.4.2. මූල්‍ය නොවන වත්කම් ඌනකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයක දී ම යම් වත්කමක් ඌනකරණය විය හැකි යම් සංඥාවක් වේ දැයි තක්සේරු කරනු ලැබේ. එවැනි යම් සංඥාවක් වේ නම් හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික ඌනකරණ පරීක්ෂාවක් සිදු කළ යුතු වේ නම් සමාගම විසින් එම වත්කම ආපසු ලබා ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක් අනෙක් වත්කම් හෝ වත්කම් කට්ටලවලින් බොහෝ දුරට ස්වාධීනව මුදල් ඇතුළට ගැලීම් ජනනය නොකරන්නේ නම් තනි වත්කමක් ලෙස නිශ්චය කළ විට එම වත්කමේ හෝ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් එය අලෙවි කිරීම සඳහා දැරිය යුතු පිරිවැය සහ එහි භාවිතයේ දී වටිනාකම අඩු කළ කල්හි එම වත්කම ආපසු ලබා ගත හැකි අගය වැඩි වේ. වත්කමක ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය ඉක්මවන අවස්ථාවල දී එම වත්කම ඌනකරණය වූවා සේ සැලකෙන අතර එහි ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. එහි භාවිතයේ දී වටිනාකම තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය පිළිබඳව කරනු ලබන වර්තමාන වෙළඳ පොළ තක්සේරු සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු-පූර්ව වට්ටම් අනුපාතිකයක් යොදා ගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයන්ට අනුව වට්ටම් කරනු ලැබේ. එය අලෙවි කිරීම සඳහා දැරිය යුතු පිරිවැයවල් අඩු කොට එහි සාධාරණ අගය තීරණය කිරීමේ දී යෝග්‍ය තක්සේරු ආකෘතියක් යොදා ගනු ලැබේ. තක්සේරු ගුණිත හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දර්ශක යොදා ගනිමින් මෙම ගණනය කිරීම් සනාථ කරනු ලැබේ.

මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගෙන යාම නිසා දැරීමට සිදු වූ ඌනකරණ අලාභ ආදායම් ප්‍රකාශයෙහි ඌනකරණ වත්කමේ කාර්යයට අනුරූප වියදම් කාණ්ඩවල දී හඳුනා ගැනෙන අතර කලින් ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණනය ස්කන්ධයට ඇතුළත් කරන ලද දේපළ බැහැර කරනු ලැබේ. මෙහි දී කලින් සිදු කරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක අගය ඉක්මවා නොයන තුරු ස්කන්ධයේ දී ද ඌනකරණය හඳුනා ගනු ලැබේ.

වත්කම් සම්බන්ධයෙන් ගත් විට කලින් හඳුනා ගන්නා ලද ඌනකරණ අලාභ තව දුරටත් නොපවතින බවට හෝ අඩු වී ඇති බවට යම් ඉඟියක් පවතින්නේ දැයි සොයා දැන ගැනීම සඳහා සෑම වාර්තාකරණ දිනයක දී ම තක්සේරුවක් සිදු කරනු ලැබේ. එවැනි ඉඟියක් පවතින්නේ නම් සමාගම විසින් ආපසු ලබා ගත හැකි අගය පිළිබඳ ඇස්තමේන්තුවක් සිදු කරනු ලැබේ. කලින් හඳුනා ගන්නා ලද ඌනකරණයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ අවසන් ඌනකරණ අලාභය හඳුනා ගත් තැන් සිට වත්කම ආපසු ලබා ගත හැකි අගය තීරණය කිරීම සඳහා යොදා ගන්නා ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත් නම් පමණකි. සිදු වී ඇත්තේ එය නම් වත්කමේ ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය තෙක් වැඩි කරනු ලැබේ. පූර්ව වර්ෂවල දී වත්කම සම්බන්ධයෙන් ඌනකරණ අලාභයක් හඳුනා ගෙන නැත් නම් වැඩි කළ එම අගයට තීරණය කෙරෙනු ඇති ධාරණ අගය, ශුද්ධ ක්ෂය කිරීම ඉක්මවිය නොහැකි ය. වත්කම ගෙන යන්නේ ප්‍රත්‍යාගණනය කළ අගය අනුව නොවේ නම් ආදායම් ප්‍රකාශයේ දී එවැනි ප්‍රතිවර්තනයක් හඳුනා ගැනෙන අතර එම ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩි වීමක් ලෙස සලකනු ලැබේ.

### 5.4.3. සාධාරණ අගය තක්සේරු කිරීම

සමාගම සාධාරණ අගය අනුව සියලු දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කරයි. සාධාරණ අගය යනු තක්සේරුව සිදු කරනු ලබන දිනට වෙළඳ පොළ සහභාගිකයන් අතර සිදු වන ක්‍රමවත් ගනුදෙනුවක දී වත්කමක් අලෙවි කිරීම සඳහා ලැබෙනු ඇති හෝ බැරකමක් පැවරීම සඳහා ගෙවනු ඇති මිල යි. සාධාරණ අගය අනුව කරනු ලබන තක්සේරුව වත්කම අලෙවි කිරීම හෝ බැරකම පැවරීම සඳහා කරන ගනුදෙනුව සිදු වන්නේ පහත දැක්වෙන වෙළඳ පොළවලින් එකක දී ය යන උපකල්පනය මත පදනම් වේ.

- වත්කම හෝ බැරකම සඳහා වූ ප්‍රධාන වෙළඳ පොළ තුළ දී, හෝ
- ප්‍රධාන වෙළඳ පොළක් නොමැති නම් වත්කම හෝ බැරකම සඳහා වඩාත් ම වාසිදායක වෙළඳ පොළ තුළ දී

ප්‍රධාන හෝ වඩාත් ම වාසිදායක වෙළඳ පොළ සමාගමට ප්‍රවේශ විය හැකි වෙළඳ පොළක් විය යුතු ය.

වත්කමක හෝ බැරකමක සාධාරණ අගය තක්සේරු කරනු ලබන්නේ වෙළඳ පොළ සහභාගිකයන් තමන්ගේ ප්‍රශස්ත ආර්ථික අවශ්‍යතාව අනුව ක්‍රියා කරන්නේ නම් වත්කම හෝ බැරකම මිලකරණය කෙරුණු විට වෙළඳ පොළ සහභාගිකයන් යොදා ගනු ඇති උපකල්පන යොදා ගනිමිනි.

සමාගම වාතාවරණයට යෝග්‍ය වූත් අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් යොදා ගැනීම උපරිම කරමින් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් යොදා ගැනීම අවම කරමින් සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත පවතින්නා වූත් තක්සේරු ශිල්ප ක්‍රම යොදා ගනියි.

මූල්‍ය ප්‍රකාශවල දී සාධාරණ අගය තක්සේරු කෙරෙන හෝ අනාවරණය කෙරෙන සියලු ම වත්කම් හා බැරකම් පහත විස්තර කෙරෙන පරිදි සමස්තයක් ලෙස සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම පදනම් කර ගෙන සාධාරණ අගය ධුරාවලිය තුළ වර්ගීකරණය කරනු ලැබේ.

**මට්ටම 1** - අනන්‍ය වත්කම් හෝ බැරකම් සඳහා ක්‍රියාකාරී වෙළඳ පොළවල් තුළ සඳහන් (නොගැළපූ) වෙළඳ පොළ මිල ගණන්

**මට්ටම 2** - සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු ශිල්ප ක්‍රම

**මට්ටම 3** - සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම නිරීක්ෂණය කළ නොහැකි තක්සේරු ශිල්ප ක්‍රම

මූල්‍ය ප්‍රකාශවල දී පුනරාවර්තී පදනමකින් හඳුනා ගැනෙන වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ගත් විට සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේ ම (සමස්තයක් ලෙස සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම පදනම් කර ගෙන) වර්ගීකරණය යළි තක්සේරු කිරීම මගින් ධුරාවලියේ මට්ටම් අතර පැවරීම් සිදු වී තිබෙන්නේ දැයි සමාගම තීරණය කරයි.

සමාගමේ කළමනාකාරිත්වය පුනරාවර්තී සාධාරණ අගය පිළිබඳ තක්සේරුව සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි තීරණය කරයි. දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවෝ සම්බන්ධ කර ගැනෙති. බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගත යුතු යැයි තීරණය කරනු ලබන්නේ

සමාගමේ විගණන කමිටුව සමග සාකච්ඡා කිරීමෙන් සහ එහි අනුමතිය ලැබීමෙන් පසුව කළමනාකාරිත්වය විසිනි. තෝරා ගැනීමේ නිර්ණායක අතරට වෙළඳ පොළ පිළිබඳ දැනුම, කීර්තිය, ස්වාධීනත්වය, සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙන යන්නේ ද යන කරුණු ඇතුළත් වේ.

### 5.5. පෙර ගෙවුම් කල් බදු වාරිකය

කල් බදු කාල පරිච්ඡේදය තුළ දී බදුකර ඉඩම් සම-වාර්ෂික පදනමක් මත ක්‍රමක්ෂය කෙරෙන අතර කල් බදු කාල පරිච්ඡේදය තුළ සරල රේඛීය ක්‍රමයක් යොදා ගනිමින් ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

### 5.6. භාණ්ඩ තොග

යල් පිනු හා මන්දගාමීව වැය වන ඇයිතමයන් නිසි ලෙස සලකා බැලීමෙන් පසුව පහළ යන පිරිවැය මත සහ විකිණීමෙන් ලබා ගත හැකි ඇස්තමේන්තුගත ශුද්ධ අගය මත භාණ්ඩ තොග තක්සේරු කරනු ලැබේ. විකිණීමෙන් ලබා ගත හැකි ශුද්ධ අගය යනු භාණ්ඩ තොගවල විකුණුම් පිරිවැය සහ/හෝ භාණ්ඩ තොග ඒවායේ වර්තමාන තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැය සලකා බැලීමෙන් පසුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ඔස්සේ එම භාණ්ඩ තොග විකිණිය හැකි මිල වේ.

භාණ්ඩ තොගයේ එක් එක් අයිතම කාණ්ඩයේ පිරිවැය හරිත සාමාන්‍ය පදනම මත නිශ්චය කරනු ලැබේ.

### 5.7. මූල්‍ය වත්කම් - හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

මූල්‍ය සාධන පත්‍රයක් යනු එක් ආයතනයකට මූල්‍ය වත්කමක් සහ තවත් ආයතනයකට මූල්‍ය බැරකමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් හිමි වන කවර හෝ ගිවිසුමකි.

#### මූල්‍ය වත්කම්

#### (a) ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙන අතර තදනන්තරව වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) යටතේ ක්‍රමක්ෂය පිරිවැය හා සාධාරණ අගය මත සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ.

ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලක්ෂණ සහ හෝටලය චම ලක්ෂණ කළමනාකරණය කිරීම සඳහා යොදා ගන්නා ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවතී. හෝටලය ප්‍රායෝගික පියවරක් ගෙන ඇති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ මුදල් සම්බන්ධයෙන් හැර හෝටලය ආරම්භයේ දී මූල්‍ය වත්කමක් තක්සේරු කරන්නේ එහි සාධාරණ අගය මත ය, ලාභය හා අලාභය යටතේ සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කමක් නොවේ නම්, එහි ගනුදෙනු පිරිවැය මත ය. හෝටලය ප්‍රායෝගික පියවරක් ගෙන ඇති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ මුදල් තක්සේරු කරනු ලබන්නේ SLFRS 15 යටතේ නිශ්චිය කෙරෙන ගනුදෙනු මිල මත ය.

වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ක්‍රමක්ෂය පිරිවැය හෝ සාධාරණ අගය මත මූල්‍ය වත්කමක් වර්ගීකරණය හෝ තක්සේරු කිරීමට නම් එම වත්කම නිසා නොගෙවූ මුල් මුදල මත 'තනිකර ම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන (SPPI)' මූල්‍ය ප්‍රවාහයන් හට ගත යුතු වේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා හෝටලය විසින් යොදා ගනු ලබන ව්‍යාපාරික ආකෘතිය යනු මූල්‍ය ප්‍රවාහයන් ජනනය කර ගැනීම සඳහා එය විසින් මූල්‍ය වත්කම් කළමනාකරණය කෙරෙන ආකාරය යි. මූල්‍ය ප්‍රවාහයන් හට ගන්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීමෙන් ද මූල්‍ය වත්කම් අලෙවි කිරීමෙන් ද නැත් නම් ඒ දෙයාකාරයෙන් ම ද යන්න ව්‍යාපාරික ආකෘතිය විසින් තීරණය කරනු ලැබේ.

වෙළඳ පොළ රෙගුලාසියකින් හෝ සම්මුතියකින් ස්ථාපිත කාල රාමුවක් තුළ මූල්‍ය වත්කම් සම්පාදනය කළ යුතු මූල්‍ය වත්කම් මිල දී ගැනීම් හෝ අලෙවි කිරීම් වෙළඳ දිනය එනම් හෝටලය විසින් වත්කම මිල දී ගැනෙන හෝ අලෙවි කෙරෙන දිනය මත හඳුනා ගනු ලැබේ.

#### (b) තදනන්තර තක්සේරුව

තදනන්තර තක්සේරුව සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ග කරනු ලැබේ:

i. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

ii. සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය වන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

iii. හඳුනා ගැනීම ඉවත් කිරීම නිසා සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය නොවන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත නිමිති කරන ලද මූල්‍ය වත්කම් (ස්කන්ධ සාධන පත්‍ර)

iv. ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම්

#### ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

හෝටලයට වඩාත් ම අදාළ වන කාණ්ඩය මෙය වේ. පහත දැක්වෙන කොන්දේසි දෙක ම සැපිරෙන්නේ නම් හෝටලය ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් තක්සේරු කරනු ඇත:

- මූල්‍ය වත්කම පවතින්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීම පිණිස මූල්‍ය වත්කම් අත් කර ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළ ය.

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි නිසා නොගෙවූ මුල් මුදල මත නියමිත දිනයන්හි දී තනිකර ම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන මූල්‍ය ප්‍රවාහයන් හට ගනී.

ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් තදනන්තරව සඵල පොලී අනුපාතික (EIR) විධික්‍රමය යොදා ගනිමින් තක්සේරු කෙරෙන අතර ඌනකරණයට යටත් වේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කෙරෙන, සංශෝධනය කෙරෙන හෝ ඌනකරණය කෙරෙන විට ලාභය හෝ අලාභය යටතේ ලාභ හා අලාභ හඳුනා ගනු ලැබේ.

හෝටලය සතු ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් අතරට මුදල් හා බැංකු ශේෂ, කෙටි කාලීන ආයෝජන, අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්, අය විය යුතු වෙළඳ මුදල් සහ ජංගම නොවන ආයෝජන ඇතුළත් වේ.

හෝටලය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර) සහ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ස්කන්ධ සාධන පත්‍ර) සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් වර්ගීකරණය නොකරයි.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### (c) හඳුනා ගැනීම ඉවත් කිරීම

ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අවස්ථාවල දී මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවල දී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ:

- වත්කමෙන් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇත; හෝ,
- හෝටලය විසින් වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරා දෙනු ලැබ හෝ ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් 'ඔබ්බට යැවීමේ' ඒකඟතාවක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ම තුන්වන පාර්ශ්වයක් වෙත ගෙවීමේ වගකීමක් භාර ගනු ලැබ හෝ ඇත; නැතහොත්,

(a) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරා දෙනු ලැබ ඇත; හෝ,

(b) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නැති නමුත් වත්කමේ පාලනය පවරා දෙනු ලැබ ඇත.

හෝටලය වත්කමකින් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරා දී ඇති විට හෝ ඔබ්බට යැවීමේ ඒකඟතාවකට ඇතුළත්ව ඇති විට හෝටලය විසින් එය හිමිකාරත්වයේ අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගෙන ඇත් ද ඒ කොතෙක් දුරට ද යන්න තක්සේරු කරනු ලැබේ. එය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් පවරා දී හෝ රඳවා ගෙන හෝ වත්කමේ පාලනය පවරා දී හෝ නොමැති නම් පවරනු ලැබූ වම වත්කමට හෝටලයේ සම්බන්ධය අඛණ්ඩව පවතින ප්‍රමාණයට හෝටලය විසින් අඛණ්ඩව වම වත්කම හඳුනා ගනු ලැබේ. එවැනි අවස්ථාවක හෝටලය විසින් ආශ්‍රිත බැරකමක් ද හඳුනා ගනු ලැබේ. පවරනු ලැබූ වත්කම සහ ආශ්‍රිත බැරකම තක්සේරු කිරීම සඳහා සමාගම විසින් රඳවා ගනු ලැබ ඇති අයිතිවාසිකම් හා බැඳීම් පිළිබිඹු වන පදනමක් යොදා ගනු ලැබේ.

හෝටලයේ අඛණ්ඩ සම්බන්ධය පවරනු ලැබූ වත්කම සම්බන්ධයෙන් ඇපවීමක ස්වරූපය ගන්නා අතර වත්කමේ මුල් ධාරණ අගයේ අවමය සහ ආපසු ගෙවීමට හෝටලයට සිදු විය හැකි මුදලේ උපරිම අගය මත තක්සේරු කරනු ලැබේ.

### (d) ඌනකරණය

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත පවත්වා ගෙන නොයන සියලු ණය සාධන පත්‍ර සම්බන්ධයෙන් අපේක්ෂිත ණය අලාභ (ECLs) සලකා බැලිය යුතු බව හෝටලය විසින් හඳුනා ගනු ලැබේ. මුල් සළුල පොලී අනුපාතිකයේ ආසන්න අගයකට වට්ටම් කෙරෙන ගිවිසුම අනුව ලැබිය යුතු ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් සහ ලැබෙනු ඇති බවට හෝටලය අපේක්ෂා කරන සියලු මූල්‍ය ප්‍රවාහයන් අතර පවත්නා වෙනස පදනම් කර ගෙන අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලැබේ. රඳවා ගන්නා ලද ඇපකර අලෙවි කිරීමෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් හෝ ගිවිසුම්ගත කොන්දේසිවල කොටසක් වන වෙනත් ණය ඉවැඩි කිරීම් අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහයන් අතරට ඇතුළත් වනු ඇත.

අය විය යුතු වෙළඳ මුදල් සම්බන්ධයෙන් ගත් විට අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී හෝටලය විසින් සරල කළ ප්‍රවිෂ්ඨයක් යොදා ගනු ලැබේ. එම නිසා හෝටලය විසින් ණය අවදානමෙහි ඇති වන වෙනස්කම් පිළිබඳව සොයා බැලීමක් නොකෙරෙන නමුත් ඒ ඒ වාර්තාකරණ දිනට අපේක්ෂිත දීර්ඝ කාලීන ණය අලාභ පදනම් කර ගෙන අලාභ සලකා බැලීමක් කළ යුතු බව හඳුනා ගනු ලැබේ. හෝටලය ණය අහිමි වීම පිළිබඳ සිය අතීත අත්දැකීම් පදනම් කර ගෙන ණයහිමියන්ට හා ආර්ථික වාතාවරණයට විශේෂිත අනාගත සාධකවලට ගළපන ලද ප්‍රතිපාදන ආකෘතියක් හඳුනා ගෙන ඇත.

## මූල්‍ය බැරකම්

### (a) ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරුව

ආරම්භක හඳුනා ගැනීමේ දී අදාළ පරිදි ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගයන් මත මූල්‍ය බැරකම්, ණය දීම් හා ණය ගැනීම්, ගෙවිය යුතු මුදල් ලෙස හෝ ක්‍රියාත්මක ඉදිරි රැකුමකට අයත් ඉදිරි රැකුම් සාධන පත්‍ර වශයෙන් නිමිති කරන ලද ව්‍යුත්පන්න ලෙස මූල්‍ය බැරකම් වර්ගීකරණය කරනු ලැබේ.

ආරම්භයේ දී සියලු මූල්‍ය බැරකම් සාධාරණ අගය මත හඳුනා ගැනෙන අතර ණය දීම් හා ණය ගැනීම් සහ ගෙවිය යුතු මුදල් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයවල් බැහැර කර හඳුනා ගනු ලැබේ.

හෝටලයේ මූල්‍ය බැරකම් අතරට ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් සහ බැංකු අයිරා ඇතුළු අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් ඇතුළත් වේ.

හෝටලය සතුව ලාභය හා අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සහ ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර නොමැත.

### (b) තදනන්තර තක්සේරුව

මූල්‍ය බැරකම් තක්සේරුව පහත විස්තර කෙරෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

#### ණය දීම් හා ණය ගැනීම්

හෝටලයට වඩාත් ම අදාළ වන කාණ්ඩය මෙය වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව පොලී සහිත ණය දීම් හා ණය ගැනීම් තදනන්තරව සළුල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. බැරකම් හඳුනා ගැනීම ඉවත් කෙරෙන විට සහ සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය යටතේ ලාභය හා අලාභය මත ලාභ හා අලාභ හඳුනා ගනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත් කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් එය සහ සළුල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ කොටසක් ලෙස පවත්නා ගාස්තු හෝ පිරිවැයවල් වේ නම් ඒවා සලකා බැලීම මගිනි. සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයවල් ලෙස ඇතුළත් කරනු ලැබේ. මෙම කාණ්ඩය සාමාන්‍යයෙන් පොලී සහිත ණය දීම් හා ණය ගැනීම්වලට අදාළ වේ.

### (c) හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට වම මූල්‍ය බැරකම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත වක ම ණය හිමියාගෙන් ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිස්ථාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කෙරෙන විට වම හුවමාරුව හෝ

සංශෝධනය කිරීම මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීම සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

### මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

වත්කම් උපලබ්ධි කිරීම හා බැරකම් පියවීම එක විට සිදු කිරීම සඳහා හඳුනා ගත් අගයන් හිලව් කිරීම පිණිස වර්තමානයේ බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් ඇත් නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් ඇත් නම් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කෙරෙන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය තුළ ශුද්ධ අගය වාර්තා කරනු ලැබේ.

### 5.8. මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති ශේෂ වශයෙන් අර්ථ නිරූපණය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා අතේ ඇති මුදල්වලින් සහ හිඟ බැංකු අයිරා බහැර කළ විට බැංකුවේ ඇති තැන්පතුවලින් මුදල් සහ මුදල් හා සමාන වත්කම් සමන්විත වේ. අත්පත් කර ගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන කෙටි කාලීන ආයෝජන ද මුදල් හා සමාන වත්කම් ලෙස සලකනු ලැබේ.

### 5.9. ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීමේ සෘජු පිරිවැයවල් බැහැර කර අය කර ගත් හෝ අය විය යුතු මුදල් හෝ වෙනත් සම්පත්වල සාධාරණ අගය මත ස්කන්ධ සාධන පත්‍ර තක්සේරු කරනු ලැබේ.

### 5.10. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 5.10.1. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දී හඳුනා ගනු ලබන බැරකමෙන් නියෝජනය වන්නේ ප්‍රක්ෂිප්ත ඒකක ණය විධික්‍රමය යොදා ගනිමින් ආයුගණක අගය පදනම් කර ගෙන ඇස්තමේන්තු කරනු ලබන වාර්තාකරණ දිනට නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය යි. ආයුගණක තක්සේරුවල දී වට්ටම් අනුපාතික හා අනාගත වැටුප් වැඩි වීම් පිළිබඳ උපකල්පනවලට වළඹීමට සිදු වේ. නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම්වලට අතිශයින් සංවේදී ය. මෙම ප්‍රතිලාභ සඳහා බැහැරින් මූල්‍ය සම්පාදනය නොකෙරේ.

සමාගම විසින් නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්මෙන් පැන නගින ආයුගණක ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වහා ම හඳුනා ගනු ලැබේ.

කෙසේ වුව ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පණත අනුව පාරිතෝෂික ගෙවීමේ බැරකම පැන නගින්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සපුරා ඇත් නම් පමණකි.

### 5.10.2. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු යම් ආයතනයක් විසින් තවත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ තව දුරටත් මුදල් ගෙවීමට නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් සඳහා දායකත්වය ලබා දීමට ඇති බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී සේවකයන් විසින් සේවාවන් සම්පාදනය කෙරෙන කාල පරිච්ඡේදයන් තුළ දී දැරිය යුතු සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

#### a) සේවක අර්ථසාධක අරමුදල (EPF)

සමාගම හා සේවකයන් විසින් පිළිගත් අර්ථසාධක අරමුදලට වික් වික් සේවකයාගේ වැටුපෙන් පිළිවෙළින් 12% ක් හා 8%ක් දායක කරනු ලැබේ.

#### b) සේවක භාරකාර අරමුදල (ETF)

සමාගම විසින් සේවක භාරකාර අරමුදලට වික් වික් සේවකයාගේ වැටුපෙන් 3%ක් දායක කරනු ලැබේ.

### 5.11. මූල්‍ය බැරකම්

### 5.11.1. ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරුව

සමාගම විසින් ගිවිසුම්ගත විධිවිධානයේ හරයට සහ මූල්‍ය බැරකම් පිළිබඳ අර්ථ නිරූපණවලට අනුකූලව ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගයන් (FVTPL) මත මූල්‍ය බැරකම් හෝ වෙනත් මූල්‍ය බැරකම් යටතට මූල්‍ය බැරකම් වර්ග කරනු ලැබේ.

සමාගම මූල්‍ය බැරකමේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත් වන විට සමාගම විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දී මූල්‍ය බැරකම් හඳුනා ගනු ලැබේ.

#### a) ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය (FVTPL) මත මූල්‍ය බැරකම

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් අතරට වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති හෝ ආරම්භක හඳුනා ගැනීමේ දී එසේ නිමිති කරන ලද මූල්‍ය බැරකම් ඇතුළත් වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් තදනන්තරව ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සාධාරණ අගය මත තක්සේරු කෙරෙන අතර එහි සිදු වන වෙනස් වීම් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනු ලැබේ.

ආරම්භක හඳුනා ගැනීම මත වත්කම අත්පත් කර ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභය හෝ අලාභය තුළ දී හඳුනා ගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් නිමිති කිරීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් සඳහා යොදා ගනු ලබන නිර්ණායක ම වේ.

#### b) වෙනත් මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම් අතරට තැන්පතු, සමාගම විසින් නිකුත් කරන ලද ණය සහ ණයට ගත් වෙනත් අරමුදල් ඇතුළත් වන අතර අත්පත් කර ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අඩු කොට සාධාරණ අගය මත ආරම්භයේ දී තක්සේරු කොට තදනන්තරව සඵල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. නිකුතුව මත යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් එය සහ සඵල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ කොටසක් ලෙස පවත්නා පිරිවැයවල් වේ නම් ඒවා සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

### 5.11.2. මූල්‍ය බැරකම් හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට එම මූල්‍ය බැරකම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස්

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

කොන්දේසි මත එක ම ණය හිමියාගෙන් ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිස්ථාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කෙරෙන විට එම හුවමාරුව හෝ සංශෝධනය කිරීම මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීමක් සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය බැරකමේ ධාරණ අගය සහ ගෙවන ලද මුදල අතර වෙනස ලාභය හෝ අලාභය යටතේ හඳුනා ගනු ලැබේ.

### 5.12. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස උද්ගත වූ වර්තමාන (නෛතික හෝ සම්ප්‍රයුක්ත) බැඳීමක් සමාගම සතු නම් සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය නම් සහ බැඳීමේ අගය පිළිබඳව විශ්වසනීය තක්සේරුවක් කළ හැකි නම් එවිට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. යම් ප්‍රතිපාදනයකට අදාළව දැරිය යුතු වියදම කවර හෝ ප්‍රතිපූරණයක් වේ නම් බැහැර කොට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දක්වනු ලැබේ.

### 5.13. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

LKAS 7 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ දී නියම කෙරෙන පරිදි වක්‍ර විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් හා සමාන වත්කම් අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකු අයිරාවලින් සමන්විත වේ.

### 5.14. ආංශික තොරතුරු

අංශයක් යනු සේවා සම්පාදනයේ නිරත සහ සෙසු අංශවලට වෙනස් අවදානම් හා ප්‍රතිලාභවලට යටත් වන වෙන් කර හඳුනා ගත හැකි සංරචකයකි. සමාගමේ සියලු මෙහෙයුම් එක ම අංශයක් ලෙස සලකනු ලබන බැවින් අංශයක් වශයෙන් වෙන් කර හඳුනා ගත හැකි සංරචක සමාගම සතු නොවේ.

### 5.15.1. නිකුත් කරන ලද නමුත් තවමත් බලාත්මක වී නැති ප්‍රමිති

නව ප්‍රමිතීන් සහ ප්‍රමිති සඳහා සංශෝධන ගණනාවක් වර්තමාන මූල්‍ය වර්ෂයෙන් පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බල පැවැත්වෙන අතර, ඊට පෙර භාවිතය සඳහා අවසර ඇතත කෙසේවෙතත් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමූහය විසින් ඒවා කල්තියා අනුගමනය කර නැත.

පහත දැක්වෙන සංශෝධිත ප්‍රමිතීන් සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකරවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

දේපල, පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන ආදායම. (LKAS 16 වන සංශෝධන).

එකී වත්කම කළමනාකාරිත්වය විසින් අපේක්ෂාකරන ආකාරයට ක්‍රියා කිරීමට හැකිවන පරිදි අදාළ අවශ්‍ය ස්ථානයට සහ/හෝ තත්වයට ගෙන ඒමේදී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විකිනීමෙන් ලැබෙන කිසියම් මුදලක් දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැයෙන් අඩු කිරීම සංශෝධන මගින් තහනම් කර ඇත. ඒ වෙනුවට ආයතනයක් එවැනි භාණ්ඩ විකිනීමෙන් ලැබෙන ආදායම සහ එකී භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිරිවැය, ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගනී.

සංකල්පමය රාමුව පිළිබඳ සඳහන (SLFRS 3 සඳහා වන සංශෝධනය - ව්‍යාපාර සංයෝජනය*ග ප්‍රමිතියේ අවශ්‍යතා සැලකිය යුතු ලෙස වෙනස් කිරීමකින් තොරව SLFRS 3 හි අඩංගු සංකල්පමය රාමුවට අදාළ යල්පිනූ සඳහනක් යාවත්කාලීන කරයි.

වගකීම් වත්මන් හෝ වත්මන් නොවන ලෙස වර්ගීකරණය කිරීම (LKAS 1 සඳහා වන සංශෝධනය).

මූල්‍ය තත්වය ප්‍රකාශ කිරීමේදී, අවිනිශ්චිත පියවීමේ දිනයක් සහිත ණය සහ අනෙකුත් වගකීම් කෙසේ වර්ගීකරණය කළ යුතුදැයි තීරණය කිරීමේදී අවශ්‍යතා යොදාගැනීමේ ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාගම්වලට උපකාර කිරීම මෙම සංශෝධනවල අරමුණ වේ. වත්මන් (වසරක් ඇතුලත ගෙවිය යුතු හෝ ගෙවිය හැකි) හෝ වත්වන් නොවන ලෙස මෙම වර්ගීකරණය සිදුකළ හැකිය.

කොවිඩ්-19 ආශ්‍රිත සහන (SLFRS 16 සඳහා වන සංශෝධන).

කොවිඩ් 19 ගෝලීය වසංගතයේ සෘජු ප්‍රතිවිපාකයක් වන කුලී සහන සඳහා බදුකරු ගිණුම් කරන ආකාරය සරල කරන විකල්ප ප්‍රායෝගික උපායමාර්ගයක් මෙයින් හඳුන්වා දෙයි. මෙම ප්‍රායෝගික උපායමාර්ගය අනුව හිමිකම් ලබන කුලී සහන කල්බදු වෙනස් කිරීමක් විය යුතුද යන්න ඇගයීමට අවශ්‍ය නොවන අතර, වෙනත් අදාළ වන මාර්ගෝපදේශයන්ට අනුකූලව ඒවා ගිණුම්ගත කරනු ලැබේ.

2018 2020 කාලය තුළ නිකුත් කරන ලද SLFRS ප්‍රමිති සඳහා වාර්ෂික වැඩි දියුණු කිරීම්.

IFRS යටතේ IFRS 1, IFRS 9, IFRS 9 සහ, IAS 41 ලෙස සිදුකරන ලද වැඩි දියුණු කරන ලද පැහැදිලි කිරීම් සහ සංශෝධන සමඟින් 2018 -2020 කාලය තුල ප්‍රමිතීන් සඳහා වැඩිදියුණු කිරීම් නිකුත් කරන ලදී.

| | | සමූහය | | |
|---|---|---|---|---|
| | | මාස 12 | මාස 12 | මාස 12 |
| | | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | | රු | රු | රු |
| 01. | **මූල්‍ය වියදම්** | | | |
| | අයිරා පොලී | **1,615** | **1,615** | |
| | බැංකු ගාස්තු | **2,736** | **2,736** | 405 |
| | | **4,351** | **4,351** | 405 |
| 02. | **තැන්පතු සහ ලැබිය යුතු මුදල්** | | | |
| | නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මත පොළී | **11,027** | **11,027** | - |
| | නීති ගාස්තු - අත්තිකාරම් තැන්පතු | **100,000** | **100,000** | - |
| | | **111,027** | **111,027** | - |
| 03. | **සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්** | | | |
| | භාණ්ඩාගාරයේ ලේකම් | **-** | **-** | 10 |
| | හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | **4,904,862** | **4,904,862** | - |
| | සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | **-** | **848,136** | - |
| | **Less:** | | | |
| | සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්මන්ට් ලිමිටඩ් - නිකුත් කල කොටස් | **-** | **(10)** | - |
| | | **4,904,862** | **5,752,988** | 10 |
| 04. | **මුදල් හා බැංකු ශේෂය** | | | |
| | බැංකු මුදල් | **4,475,171** | **4,475,171** | 996,855 |
| | අතැති මුදල් | **100,000** | **100,000** | - |
| | කෙටිකාලීන ආයෝජන (REPO) | **5,000,000** | **5,000,000** | - |
| | | **9,575,171** | **9,575,171** | 996,855 |

| | | සමූහය | සමාගම | |
|---|---|---|---|---|
| | | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| 05. | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| | නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ | | | |
| | සාමන්‍ය කොටස් | **2,000,000** | **2,000,000** | 1 |

මුදල් අමාත්‍යංශය විසින් 2021 ජනවාරි 22 දින ආරම්භක ප්‍රාග්ධනය ලෙස රු. 20,000,000/- ආයෝජනය කරන ලදී.

| | | සමූහය | සමාගම | |
|---|---|---|---|---|
| | | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | | රු | රු | රු |
| 06. | **සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්** | | | |
| | හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | - | - | 223,920 |
| | | - | - | 223,920 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 07. 2021 දෙසැම්බර් 31 දිනට මිනුම් පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය

| මූල්‍ය වත්කම් වර්ගීකරණය | සමූහය | සමාගම | |
|---|---|---|---|
| | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | රු | රු | රු |
| | ණය හා ලැබිය යුතු | ණය හා ලැබිය යුතු | ණය හා ලැබිය යුතු |
| **ජංගම වත්කම් තුල වූ මූල්‍ය උපකරණ** | | | |
| සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | **4,904,862** | **5,752,988** | - |
| බැංකු හා අතැති මුදල් | **9,575,171** | **9,575,171** | 996,855 |
| එකතුව | **14,480,033** | **15,328,159** | 996,855 |

| මූල්‍ය වගකීම් වර්ගීකරණය | | ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වගකීම් | |
|---|---|---|---|
| | සමූහය | සමාගම | |
| | 31.12.2021 | 31.12.2021 | 31.12.2020 |
| | රු | රු | රු |
| **ජංගම වගකීම් තුල වූ මූල්‍ය උපකරණ** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | **4,005,618** | **4,005,618** | 150,000 |
| සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් | - | - | 223,920 |
| එකතුව | **4,005,618** | **4,005,618** | 373,920 |

## 08. මූල්‍ය අවදානම් කළමනාකරණය

සමූහයේ ක්‍රියාකාරකම් වෙළෙඳපොළ අවදානම (විනිමය අවදානම, පොලී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වැනි විවිධ මූල්‍ය අවදානම්වලට ලක් වේ. සමූහයේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මූල්‍ය අවදානම්වල අනපේක්ෂිත බව කෙරෙහි අවධානය යොමු කරන අතර සමූහයේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට ඇති විය හැකි විභව අහිතකර බලපෑම් අවම කිරීමට උත්සාහ කරයි. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදු කරනු ලැබේ.

සමූහයේ ප්‍රධාන මූල්‍ය උපකරණ කෙටි කාලීන තැන්පතු, මූල්‍ය වෙළෙඳපොළ ආයෝජන සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා ද්‍රවශීලතාව ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සහ සමූහයේ මූල්‍ය සංචිතවල ප්‍රතිලාභ උපරිම කිරීමයි. සමූහයට එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලින් සෘජුවම පැන නගින වෙළඳ ලැබිය යුතු හා වෙළඳ ගෙවිය යුතු වෙනත් විවිධ මූල්‍ය උපකරණ ඇත.

### 08.1 ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට තුඩු දෙන මූල්‍ය උපකරණයක් හෝ පාරිභෝගික කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රති පාර්ශ්වයක් තම වගකීම ඉටු නොකිරීමේ අවදානමයි. සමාගම එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු) සහ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ණය අවදානමට ලක් වේ.

පිළිගත්, ණයට සුදුසු තෙවන පාර්ශ්වයන් සමග පමණක් සමාගම වෙළඳාම් සිදු කරයි.ණය කොන්දේසි මත වෙළඳාම් කිරීමට කැමති සියලුම ගනුදෙනුකරුවන් ණය සත්‍යාපන ක්‍රියා පටිපාටිවලට යටත් වීම හෝටලේ ප්‍රතිපත්තියයි. මීට අමතරව, ලැබිය යුතු ශේෂයන් අඛණ්ඩ පදනමක් මත අධීක්ෂණය කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ බොල් ණයවලට නිරාවරණය වීම සැලකිය යුතු නොවේ.

### 08.2 ණය අවදානම් නිරාවරණය

සාමන්‍යයෙන් ණය අවදානමට යටත් වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වයන් වීවායේ රැගෙන යා හැකි ප්‍රමාණයන්ට සමාන වේ. (ඇපයක් සලකා බැලීමකින් තොරව, තිබේ නම්) පහත වගුවේ උපරිම අවදානම් ස්ථාන පෙන්වයි.

| රු.වලින් | සමාගම<br>2021 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | බැංකු හා අතැති මුදල් | වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | එකතුව |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | - | 111,027 | | 111,027 |
| සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | - | - | 5,752,988 | 5,752,988 |
| බැංකු හා අතැති මුදල් | 9,575,171 | - | | 9,575,171 |
| මුළු ණය අවදානම් නිරාවරණය | 9,575,171 | 111,027 | 5,752,988 | 15,439,186 |

| රු.වලින් | සමූහය<br>2021 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | බැංකු හා අතැති මුදල් | වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | එකතුව |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | - | 111,027 | | 111,027 |
| සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් | - | - | 4,904,862 | 4,904,862 |
| බැංකු හා අතැති මුදල් | 9,575,171 | - | | 9,575,171 |
| මුළු ණය අවදානම් නිරාවරණය | 9,575,171 | 111,027 | 4,904,862 | 14,591,060 |

### 08.3 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හි පරිපාලිත සමාගම්වලින් ගෙවිය යුතු මුදලින් සමන්විත වේ.

### 08.4 මුදල් හා මුදල් සමාන දෑ සම්බන්ධ ණය අවදානම

වත්මන් ශ්‍රේණිගත කිරීම් සහ ආර්ථික දැක්ම මත පදනම්ව, මූලික සහ වෙළඳපල දර්ශක විශ්ලේෂණය කිරීම සැලකිල්ලට ගනිමින් සමූහය විසින් පිළිගත හැකි මුදල් ප්‍රතිපක්ෂවල බලයලත් ලැයිස්තුවක් පවත්වාගෙන යයි. සමූහය විසින් 2021 දෙසැම්බර් 31 දිනට රු.9,575,171.16 ක මුදල් හා මුදල් සමාන දෑ පවත්වා ගනී.

### 08.5 ද්‍රවශීලතා අවදානම

කෙටි හා මධ්‍යකාලීන අරමුදල් වගකීම් සපුරාලීමට සහ ඕනෑම අනපේක්ෂිත වගකීම් සහ අවස්ථාවන් සපුරාලීමට සමූහය සතුව අරමුදල් පවතින බව සහතික කිරීමට ප්‍රමාණවත් මට්ටමක මුදල් තබා ගනී.

සමූහය දෛනික මුදල් කළමනාකරණ ක්‍රියාවලියක් භාවිතා කරමින් අරමුදල් හිඟයට ඇති අවදානම නිරීක්ෂණය කරයි. මෙම ක්‍රියාවලියේ දී සමූහයේ මූල්‍ය ආයෝජන සහ මූල්‍ය වත්කම් (උදා.ලැබිය යුතු ගිණුම්, වෙනත් මූල්‍ය වත්කම්) සහ මෙහෙයුම් වලින් ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහ යන දෙකෙහිම කල්පිරීම සලකා බලයි.

| ශුද්ධ (ණය)/මුදල් | 2021 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | සමූහය | සමාගම |
| | 31.12.2021 | 31.12.2021 |
| | රු | රු |
| බැංකු හා අතැති මුදල් | 9,575,171 | 9,575,171 |
| මුළු ද්‍රවශීල වත්කම් | 9,575,171 | 9,575,171 |
| | | |
| ශුද්ධ (ණය)/මුදල් | 9,575,171 | 9,575,171 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 08.6 පරිණත විශ්ලේෂණය

2021 දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ සාරාංශය පහත වගුවේ වේ.

| | 2021 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | සමූහය | සමාගම | |
| රු.වලින් | වසරකින් | වසරකින් | එකතුව |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 4,005,618 | 4,005,618 | 4,005,618 |
| | 4,005,618 | 4,005,618 | 4,005,618 |

### 08.7 වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යනු වෙළඳපොල මිල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයේ සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. මූල්‍ය උපකරණ භාවිතය සහ විශේෂයෙන්ම මූල්‍ය අවදානම් සහ වෙනත් ඇතැම් මිල අවදානම් හේතුවෙන් හෝටලය වෙළඳපොල අවදානමට ලක්වේ.

### 09. වාර්තා කළ දිනට පසු සිදුවීම්

පහත සඳහන් දේවා හැර වෙනත් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීම් වාර්තා කළ දිනට පසුව සිදු වී නොමැත.

2021 ජනවාරි 22 වන දින ශ්‍රී ලංකා මුදල් අමාත්‍යංශය විසින් රු.20,000,000 ක් සමාගමේ ආරම්භක ප්‍රාග්ධනය ලෙස ආයෝජන කර ඇත.

### 10. ප්‍රාග්ධන වගකීම්

පහත සඳහන් දේවා හැර මෙම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය වන ප්‍රාග්ධන වගකීම් හෝ අවිනිශ්චිත වගකීම් නොමැත.

### 11. අවිනිශ්චිත වගකීම්

ශේෂපත්‍ර දිනට හදුනා ගත් අවිනිශ්චිත වගකීම් නොමැත.

### 12. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

### 12.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් සමග ගණුදෙනු

සම්බන්ධිත පාර්ශ්ව යන්නට සමාගමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය හා වගකීම ඇති පුද්ගලයින් ලෙස අර්ථ දැක්වෙන ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් ඇතුලත් වේ.

මෙම කාලසීමාව තුළ අධ්‍යක්ෂකවරුන්ගේ වේතන ගෙවා නොමැත.

### 12.2 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් (සටහන් 3 බලන්න)

### 12.3 සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් (සටහන් 6 බලන්න)

| | සමූහය | සමාගම |
|---|---|---|
| | 31.12.2021 | 31.12.2021 |
| | රු | රු |
| **12.4 සම්බන්ධිත පාර්ශ්ව සමග ගණුදෙනු** | | |
| **පරිපාලන/ හෝටල් සමූහය** | | |
| I. හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | 4,904,862 | 4,904,862 |
| III. සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | - | 848,136 |

### සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු නියම හා කොන්දේසි

සම්බන්ධිත පාර්ශ්ව සමග ගණුදෙනු සාමාන්‍ය ව්‍යාපාරයේ සිදු කෙරේ. වසර අවසානයේ ජංගම ගිණුමේ හිඟ ශේෂයක් වන අතර අනාරක්ෂිත, පොලී රහිත වන අතර පියවීම මුදලින් සිදුවේ.

## 13. පරිපාලිතවල ආයෝජනය - සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්

සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් (SLIL හෝ SPV හෝල්ඩින්), 2021 ජුනි 20 වන දින සංස්ථාපිත කරන ලද අතර, සම්පූර්ණ අයිතිය ඇති පරිපාලිතයක් වන සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් (මින් ඉදිරියට ("SIL") ලෙස සඳහන් වේ) SIL 100% ක් රජය සතු ආයතනයක් ලෙස දිගටම පවතිනු ඇත, එහි කොටස් වලින් 100%ක් භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

කැන්විල් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි වත්කම් SIL වෙත පැවරීම ඉදිරියේදී සලකා බැලිය යුතු බවට යෝජනා කිරීමට SLIL හි අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත.

වත්කම් SLIL වෙත පැවරීමේදී, අදාළ වත්කම් කළඹේ වෙනත් වත්කම් දෙකක් සම්බන්ධයෙන් වන කොටස්හිමියන්ට, එනම්, හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිවඩ් සහ හොටෙල් කළමිඹු (1963) ලිමිවඩ්, SLIL හි කොටස්,අදාළ කළඹවල ඔවුන්ගේ ශුද්ධ වත්කම් වටිනාකමට අනුපාතව නිකුත් කරනු ලැබේ. ස්වර්ණ කොටස් අයිතීන් සමග පහසුකම් සපයන ප්‍රවර්ධකයා ලෙස SIL හි භූමිකාව සැලකිල්ලට ගනිමින් SLIL හි කොටස්වලින් 100% ක් දක්වා SIL දිගටම රඳවා ගනු ඇත.

## 14. වාර්තා කරන දිනට නඩු කටයුතු

2021 ජූලි 07 වන දින කපිල රේණුක පෙරේරා මහතා (පෙත්සම්කරු) මූලික අයිතිවාසිකම් නඩුවක් (ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ලෙස) ඔහුගේ හැකියාවෙන්) (උදා.මහජන අවශ්‍යතා නඩුවක්) සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, ගරු.නීතිපති, අගමැති, මුදල් අමාත්‍ය, භාණ්ඩාගාර ලේකම්, විනිමය කොමිෂන් සභාවේ සුරුකුම්පත් සහ වෙනත් වෙතට විරෙහිව ගොනු කර ඇත. එම මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කරනු ලැබුයේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය යටතේ සහතික කර ඇති ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත යන පදනම මතය. ඔහු විසින් චෝදනාව කරන ලද උල්ලංඝනය වනුයේ, රාජ්‍ය සතු වත්කම් කිහිපයක් ස්ථිර ලෙස සහ/ හෝ උපක්‍රමශීලිව පුද්ගලික අංශයට පවරා තිබීම වේ. (පුද්ගලීකරණය කර ඇත.) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කිසිදු අතුරු නියෝගයක්/තහනම් නියෝගයක් ලබා දී නොමැති අතර, මෙම දිනය වන විට මෙම කාරණය නිවාඩු ක්‍රියාවලිය සඳහා දක්වා නොමැත. සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සහ සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් විසින් විරෝධතා ගොනු කර ඇති අතර සමාගමේ විරෝධතා ගොනුව මත පදනම්ව 2022 අප්‍රේල් 7 වැනි දින නඩුව කැඳවීමට නියමිතය.

# රැස්වීම කැඳවීමේ නිවේදනය

සෙලෙන්දිවා ඉන්වෙස්මන්ට්ස් සමාගමේ දෙවන වාර්ෂික මහා සභා රැස්වීම 2022 ඔක්තෝම්බර් මස 31 දින ප.ව. 3.30 ට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, අංක 2 දරන ස්ථානයේ පිහිටි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**නඃාය පත්‍රය**

1. රැස්වීම කැඳවීමේ නිවේදනය පිළිගැනීම සඳහා පහත සඳහන් යෝජනාව සම්මත කර ගැනීම:

   සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ 2022 ඔක්තෝම්බර් 26 දිනැති නිවේදනය සමාගම් රෙගුලාසි වල සහ 2007 සමාගම් පනතේ අංක 07 වගන්තිය යටතේ දක්වා ඇති නියමයන්ට වඩා කෙටි දැනුම්දීමකින් නිකුත්කර ඇති නමුත්, එය වලංගු නිවේදනයක් ලෙස පිළිගන ලැබේ.

2. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ ගිණුම් වාර්තාව සමඟ විගණක වාර්තාව ලබා ගැනීම සහ සලකා බැලීම.

3. සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස වයස අවුරුදු 78 ක් වන පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා නැවත පත්කිරීම සඳහා පහත දක්වා ඇති සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම:

   වයස අවුරුදු 78 ක් වන පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා සඳහා 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වන වගන්තියේ දක්වා ඇති වයස් සීමාව අදාළ නොවන බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ඔහු සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබ ඇති බවත් මෙයින් තීරණය කරනු ලැබේ.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය එක්ව, සමාගමේ විගණක ලෙස විගණකාධිවරයා අඛණ්ඩව කටයුතු කරන බව සටහන් කර ගැනීම.

**සෙලෙන්දිවා ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ් සමාගමේ**
**පී. ඩබ්ලිව්.සමාගම් ලේකම්වරු (පුද්ගලික) සමාගම**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි**

**ලේකම්වරු**

කොළඹදී
2022 ඔක්තෝම්බර් 26

**සටහන:**

- තමන් වෙනුවෙන් රැස්වීම් වලට සහභාගී වීමට සහ ඡන්දය පාවිච්චි කිරීමට පෙරකලාසිකරුවකු පත් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට හිමිකම ඇත.

- පෙරකලාසිකරු සමාගමේ කොටස් හිමියකු වීම අවශ්‍ය නොවේ.

- මේ සමග අමුණා ඇති ප්‍රොක්සි පෝරමය රැස්වීම පැවැත්වීමට පැය 36කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

# ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘති පත්‍රය

.....

ස්ථානයේ පදිංචි .....

වන මම/අපි සෙලෙන්දිවා ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ්හි සාමාජිකයෙකු/සාමාජිකාවක/සාමාජිකයන් වන අතර, 2022 ඔක්තෝම්බර් මස 31 දින ප.ව. 3.30 ට පැවැත්වීමට නියමිත සමාගමේ දෙවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී සහ එහි යම් කල් තැබූ සැසි වාරයකදී මා/අප නියෝජනය කරමින් ඊට සහභාගි වීමට සහ එම රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකදීම මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට මාගේ/අපගේ පෙරකලාසිකරු

වශයෙන් .....

යන ස්ථානයේ පදිංචි .....

යන අය පත් කරන අතර ඔහු/ඇය අපොහොසත් වේ නම්,

| | |
|---|---|
| පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා | කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම් |
| මහ තන්ත්‍රිගේ ඉන්දීවරී විශාඛා අමරසේකර මහත්මිය | කොළඹ, හෝ ඇය අපොහොසත් වන්නේ නම් |
| රණතුන් අච්චිගේ ලක්මින් උදයකුමාර මහතා | කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම් |
| පැටිකිරි ආරච්චිගේ සුසන්ත අතුල කුමාර මහතා | කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම් |
| ඇන්ටන් බ්‍රින්ස්ලි රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා | කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම් |
| පෙට්ටගන් පණ්ඩුල ශ්‍රී රෝහණ ද සිල්වා මහතා | |

| | **න්‍යායපත්‍ර කරුණු** | **පක්ෂව** | **විපක්ෂව** |
|---|---|---|---|
| 1. | රැස්වීම කැඳවීමේ නිවේදනය පිළිගැනීමට | ☐ | ☐ |
| 2. | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ ගිණුම් වාර්තාව සමඟ විගණක වාර්තාව ලබා ගැනීමට සහ සලකා බැලීමට | ☐ | ☐ |
| 3. | රැස්වීම කැඳවීමේ නිවේදනයේ අංක 3 යටතේ සඳහන් කර ඇති පරිදි P.A.I.S. පෙරේරා මහතා නැවත පත්කිරීමේ සාමාන්‍ය යෝජනාව සම්මත කිරීමට | ☐ | ☐ |
| 4. | සමාගමේ විගණක ලෙස විගණකාධිවරයා අඛණ්ඩව කටයුතු කරන බව සටහන් කර සහ විගණකවරුන්ගේ වේතනය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම සටහන් කර ගැනීමට. | ☐ | ☐ |

වර්ෂ 2022 ක් වූ ..... වන මෙදින අත්සන් තබන්නට යෙදිණ.

.....
කොටස්කරුගේ අත්සන

**සටහන:**

1. ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් ඊළඟ පිටුවෙන් දක්වා ඇත.

2. පෙරකලාසිකරු සමාගමේ කොටස් හිමියෙකු වීම අවශ්‍ය නොවේ.

3. ඡන්දය ලබා දීම සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් ලබා දීමට කරුණාකර අදාළ කොටුවේ "X" සලකුණු යොදන්න

# ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘති පත්‍රය

**පෙරකලාසිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

1. අදාළ හිස් තැනෙහි ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය පැහැදිලිව ලියා අත්සන හා දිනය යොදා පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

2. පෙරකලාසිය නීතිඥයෙකු විසින් අත්සන් කරනු ලබන්නේ නම් හා ඒ සඳහා වන ඇටෝර්නි බලය සමාගමේ ලියාපදිංචි කර නොමැති නම් පෙරකලාසිය සමග අදාළ ඇටෝර්නි බලපත්‍රයද ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සමාගමක්/ සමායතනයක් සම්බන්ධයෙන් නම්, පෙරකලාසිය නීත්‍යනුකූලව නියම කර ඇති ආකාරයෙන් සම්පූර්ණ කර සහතික කළ යුතුය.

4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීම ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය 36 කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

5. රැස්වීම සඳහා සහභාගි වීමට (සමාගමේ අධ්‍යක්ෂවරයෙකු නොවන) පෙරකලාසිකරුවෙකු පත් කරන කොටස් හිමියෙකු වීම පෙරකලාසිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පෙරකලාසි ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු අතර රැස්වීමට පැමිණෙන විට තම ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස පෙරකලාසිකරුගෙන් ඉල්ලා සිටිය යුතුය.

# ආයතනික තොරතුරු

**සමාගමේ නම:**

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

**නීති ආකෘතිය:**

රාජ්‍ය සතු සීමාසහිත සමාගමකි

**සංස්ථාගත කළ දිනය:**

2020 ජූලි මස 3 වන දින

**සමාගම ලියාපදිංචි අංකය:**

PB 00223687

**අධ්‍යක්ෂකවරුන්:**

පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා - සභාපති

පැටිකිරි ආරච්චිගේ සුසන්ත අතුල කුමාර මහතා

මහා තන්ත්‍රීගේ ඉන්දිවරි විශාඛා අමරසේකර මහත්මිය

ඇන්ටන් බ්‍රන්ස්ලි රොහාන් ප්‍රනාන්දුපුල්ලේ මහතා

රණතුන් ආරච්චිගේ ලක්මින් උදය කුමාර මහතා

පෙට්ටගන් පණ්ඩුල ශ්‍රී රෝහණ ද සිල්වා මහතා

ඉහත අධ්‍යක්ෂකවරුන් සමාගමේ කොටස් නොදරයි.

**කාර්යාල ලිපිනය:**

**සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්**
නො. 2, ශ්‍රී චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.
දුරකථන: +94 112433435
ෆැක්ස්: +94 112446545
ඊමේල්: info@investselendiva.com
වෙබ් පිටුව: www.investselendiva.com

**ලේකම් හා රෙජිස්ට්‍රාර්:**

පී.ඩබ්ලිව්. කෝපරේට් සෙකට්රියල් ප්‍රයිවට් ලිමිටඩ්
නො. 3/17 කිංස්ලි පාර,
කොළඹ 08.

**බැංකුකරුවන්:**

මහජන බැංකුව - ආයතනික ශාඛාව

**නීතිඥවරුන්:**

නීතිපති දෙපාර්තමේන්තුව

**විගණකවරුන්:**

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
පොල්දූව පාර, බත්තරමුල්ල.

This Annual Report is conceptualised, designed and produced by Redworks.

REDWORKS
Member of the Ogilvy Group